*සැ. යු.*– 2006.07.14 දින පළවූ අංක 1,454 දරන ගැසට් පත්‍රයේ IV(අ) කොටස පළ නොකරන ලදී.
පොත් නාමාවලියේ ඔක්තෝබර්-දෙසැම්බර් කාර්තුව 1999 ඉංග්‍රීසි භාෂාවෙන් මෙවර *ගැසට් පත්‍රයේ* V කොටසේ පළවේ.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 1,455 - 2006 ජූලි 21 වැනි සිකුරාදා - 2006.07.21**

(ආණ්ඩුවේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : (I) වැනි ඡෙදය - සාමාන්‍ය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙන ම පිටු අංක යොදා ඇත.)

| | පිටුව |
|---|---|
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය ... | — |
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... | 594 |
| අමාත්‍ය මණ්ඩලය විසින් කරන ලද පත්කිරීම් ආදිය ... ... | 598 |
| රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — |
| අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — |
| වෙනත් පත්කිරීම් ආදිය ... ... ... | — |
| රෙජිස්ට්‍රාර්වරුන්ගේ පත්කිරීම් ආදිය ... ... | — |
| ආණ්ඩුවේ නිවේදන ... .. | 599 |
| මිළ පාලන දැන්වීම් .. ... | — |
| ශ්‍රී ලංකා මහ බැංකුවේ දැන්වීම් .. ... | — |
| ශ්‍රී ලංකාණ්ඩුවේ ගිණුම් ප්‍රකාශන .. ... | — |
| ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා .. ... | — |
| විවිධ දෙපාර්තමේන්තු දැන්වීම් .. ... | 600 |
| නාවියන්ට දැන්වීම් .. ... | — |
| සුරාබදු ආඥාපනත පිළිබඳ දැන්වීම් .. ... | — |

*සැ. යු.*–(i) උඩරට විවාහ හා දික්කසාද (සංශෝධන) පනත් කෙටුම්පත 2006 ජුනි මස 16 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී

(ii) මුස්ලිම් විවාහ හා දික්කසාද (සංශෝධන) පනත් කෙටුම්පත 2006 ජුනි මස 16 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී

(iii) සූදු (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත 2006 ජුනි මස 16 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

*ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි* සෑම කොටසකටම අග පිටුවෙහි සෑම මාසයකම මුල් සතියේ දී පළ කරනු ලබන ගැසට් නිවේදන බාර ගන්නා අවසාන දිනය සහ වේලාව සඳහන් නිවේදන කෙරෙහි ඔබගේ අවධානය මින් යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* සෑම කොටසකම පළකළ යුතු *ගැසට් නිවේදන* භාර ගන්නා වේලාව, *ගැසට් පත්‍රය* ප්‍රසිද්ධ කරනු ලබන සිකුරාදා දිනට සති දෙකකට පෙර එළඹෙන සිකුරාදා දිනයෙහි දහවල් 12ට අවසන් කරනු ලැබේ. තනතුරු –ඇබෑර්තු, ටෙන්ඩර් දැන්වීම්, වෙන්දේසි පිළිබඳ දැන්වීම් යනාදියෙහි සඳහන් කරනු ලබන අවසාන දිනය සහ වේලාවන් ඊට අනුරූපව - එනම් දැන්වීම්, රජයේ මුද්‍රණාලයට එවන සහ එම දැන්වීම් පළ කරන දින අතර සෑහෙන කාල වේලාවක් දෙමින් එම දැන්වීම්වල සඳහන් කරුණු කෙරෙහි උනන්දුවක් දක්වන සෑම කෙනෙකුටම ප්‍රයෝජනවත් වන පරිදි ඊට සහභාගිවීමට ඉඩ ප්‍රස්ථාවක් සැළසෙනසේ සකස් කරන මෙන් සියලුම දෙපාර්තමේන්තු, සංස්ථා, මණ්ඩල යනාදියෙන් මින් ඉල්ලා සිටිනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම පිණිස එවන සෑම දැන්වීමක්ම *ගැසට් පත්‍රය* ප්‍රසිද්ධ කරනු ලබන දිනට සති දෙකකට පෙර–එනම් 2006 ජූලි මස 28 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයට* යායුතු දැන්වීම් 2006 ජූලි මස 14 වැනි දින දහවල් 12.00 ට හෝ ඊට පෙර රජයේ මුද්‍රණාලයට ලැබෙන සේ එවිය යුතුයි.

**ලක්ෂමන් ගුණවර්ධන,**
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

2006 ජනවාරි මස 01 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

# ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය

2006 අංක 160

DRF/RECT/770(XV).

## ශ්‍රී ලංකා යුද්ධ හමුදාව-ස්ථිර බල හමුදාව

අතිගරු ජනාධිපතිතුමාණන් විසින් අනුමත කරන ලද තනතුරු අත්හැරීම් සහ පත් කිරීම්

### තනතුරු අත්හැරීම් හා පත්කිරීම්

*අ. 2005 නොවැම්බර් මස 29 වැනි දින සිට* :-

(1) මේජර් ජෙනරාල් එම්ඩීඑස් චන්ද්‍රපාල ආර්ඩබ්පී ආර්එස්පී යූඑස්පී එන්ඩීසී පීඑස්සී - ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ නියෝජ්‍ය මාණ්ඩලික ප්‍රධාන තනතුර අත් හැරීම

*ආ. 2005 දෙසැම්බර් මස 06 වැනි දින සිට* :-

(1) ලුතිනන් ජෙනරාල් ජීඑස්සී පොන්සේකා ආර්ඩබ්පී ආර්එස්පී ආර්සීඩීඑස් පීඑස්සී - ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ මාණ්ඩලික ප්‍රධාන තනතුර අත්හැරීම

(2) මේජර් ජෙනරාල් එන් මල්ලවාරච්චි ආර්ඩබ්පී යූඑස්පී එන්ඩීසී පීඑස්සී - ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බලසේනාවේ සේනාවිධායක තනතුර අත්හැරීම හා ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ මාණ්ඩලික ප්‍රධාන වශයෙන් පත් කිරීම

(3) මේජර් ජෙනරාල් පීඑස්බී කුලතුංග ආර්එස්පී යූඑස්පී යූඑස්ඒඩබ්සී - ආරක්ෂක සේනා මූලස්ථානය (වන්නි) ආඥාපති තනතුර අත්හැරීම හා ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ නියෝජ්‍ය මාණ්ඩලික ප්‍රධාන වශයෙන් පත් කිරීම

(4) මේජර් ජෙනරාල් ඩබ්යූබී එදිරිසිංහ - යුද්ධ හමුදා මූලස්ථානයේ විධායක ජෙනරාල් තනතුර අත්හැරීම හා ආරක්ෂක සේනා මූලස්ථානය (වන්නි) ආඥාපති වශයෙන් පත් කිරීම.

අතිගරු ජනාධිපතිතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2005 දෙසැම්බර් මස 12 වැනි දින,
කොළඹ දී ය.

07-386/1

---

2006 අංක 161

DRF/RECT/770(XV).

## ශ්‍රී ලංකා යුද්ධ හමුදාව-ස්ථිර බල හමුදාව

අතිගරු ජනාධිපතිතුමිය විසින් අනුමත කරන ලද නිළ ස්ථිර කිරීම්

(1) පහත නම් සඳහන් ජ්‍යෙෂ්ඨ නිලධාරීන් 2005.12.02 වැනි දින සිට මේජර් ජෙනරාල් නිලයේ ස්ථිර කිරීම අතිගරු ජනාධිපතිතුමිය විසින් අනුමත කර ඇත.

අ. බ්‍රිගේඩියර් (තාවකාලික මේජර් ජෙනරාල්) නිස්සංක විජේසිංහ, යූඑස්පී එන්ඩීසී අයිජී

ආ. බ්‍රිගේඩියර් (තාවකාලික මේජර් ජෙනරාල්) සුමති රන්ජන් බාලසූරිය, යූඑස්පී එන්ඩීසී පීඑස්සී අයිජී

ඇ. බ්‍රිගේඩියර් (තාවකාලික මේජර් ජෙනරාල්) වට්ටගාමිණී උපාලි බංඩාර එදිරිසිංහ

ඈ. බ්‍රිගේඩියර් (තාවකාලික මේජර් ජෙනරාල්) හෙන්දවිතාරන කපිල ගාමිණී හෙන්දවිතාරන, යූඑස්පී

ඉ. බ්‍රිගේඩියර් (තාවකාලික මේජර් ජෙනරාල්) දුල්සිරි උදේනි මුණසිංහ ආර්ඩබ්පී ආර්එස්පී යූඑස්පී එන්ඩීසී

අතිගරු ජනාධිපතිතුමියගේ අණ පරිදි,

මේජර් ජනරාල් අශෝක කේ ජයවර්ධන, ආර්ඩබ්පී ආර්එස්පී,
වීඑස්වී, යූඑස්පී
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, අමාත්‍යාංශය.

2005 දෙසැම්බර් මස 09 වැනි දින,
කොළඹ දී ය.

07-386/2

---

2006 අංක 162

DRF/RECT/770(XV).

## ශ්‍රී ලංකා යුද්ධ හමුදාව-ස්ථිර බල හමුදාව

අතිගරු ජනාධිපතිතුමාණන් විසින් අනුමත කරන ලද තනතුරු අත්හැරීම් හා පත් කිරීම්

### තනතුරු අත්හැරීම් හා පත් කිරීම්

අ. 2005 දෙසැම්බර් මස 10 වැනි දින සිට :-

(1) මේජර් ජෙනරාල් ඩබ්බී පීරිස් යූඑස්පී - යුද්ධ හමුදා මූලස්ථානයේ යුධෝපකරණ මාස්ටර් ජෙනරාල් තනතුර අත්හැරීම

(2) බ්‍රිගේඩියර් ඒබී තෝරදෙනිය - යුද්ධ හමුදා මූලස්ථානයේ කාර්ය නියුක්ත යුධෝපකරණ මාස්ටර් ජෙනරාල් වශයෙන් පත් කිරීම

ආ. 2005 දෙසැම්බර් මස 14 වැනි දින සිට :-

(1) බ්‍රිගේඩියර් එච්එම්ඩබ්පී බණ්ඩාර ආර්එස්පී පීඑස්සී - යුද්ධ හමුදා මූලස්ථානයේ කාර්ය නියුක්ත උපකරණ මාස්ටර් ජෙනරාල් වශයෙන් පත් කිරීම

ඇ. 2005 දෙසැම්බර් මස 16 වැනි දින සිට :-

(1) මේජර් ජෙනරාල් එන් විජේසිංහ යූඑස්පී එන්ඩීසී අයිජී - යුද්ධ හමුදා මූලස්ථානයේ උපකරණ මාස්ටර් ජෙනරාල් තනතුර අත් හැරීම හා යුද්ධ හමුදා මූලස්ථානයේ විධායක ජෙනරාල් වශයෙන් පත් කිරීම

ඈ. 2005 දෙසැම්බර් මස 20 වැනි දින සිට :-

(1) මේජර් ජෙනරාල් එන්ජ් රණසිංහ ආර්එස්පී යූඑස්පී පීඑස්සී - 56 වැනි සේනාංකයේ සේනාංකාධිපති තනතුර අත් හැරීම

(2) මේජර් ජෙනරාල් ටීඩබ් ජයවර්ධන ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී - 23 වැනි සේනාංකයේ සේනාංකාධිපති තනතුර අත් හැරීම හා 22 වන සේනාංකයේ සේනාංකාධිපති වශයෙන් පත් කිරීම

(3) බ්‍රිගේඩියර් එල්බීආර් මාර්ක් ආර්එස්පී - 51 සේනාංකයේ කාර්ය නියුක්ත සේනාංකාධිපති වශයෙන් පත් කිරීම

ඉ. 2005 දෙසැම්බර් මස 21 වැනි දින සිට :-

(1) මේජර් ජෙනරාල් පී පන්නිපිටිය ආර්එස්පී යූඑස්පී - 51 වන සේනාංකයේ සේනාංකාධිපති තනතුරු අත් හැරීම

(2) බ්‍රිගේඩියර් එල්ඒඩී අමරතුංග ආර්එස්පී යූඑස්පී - මෙහෙයුම් ආඥාපති මූලස්ථානය - කොළඹ කාර්ය නියුක්ත ආඥාපති වශයෙන් පත් කිරීම

ඊ. 2005 දෙසැම්බර් මස 22 වැනි දින සිට :-

(1) බ්‍රිගේඩියර් එස්ජ්පීපී සමරසිංහ ආර්එස්පී පීඑස්සී - යුද්ධ හමුදා මූලස්ථානයේ ජනමාධ්‍ය අධ්‍යක්ෂ මණ්ඩලයේ අධ්‍යක්ෂ වශයෙන් පත් කිරීම

උ. 2005 දෙසැම්බර් මස 30 වැනි දින සිට :-

(1) බ්‍රිගේඩියර් ආර්එම්ඩී රත්නායක ආර්ඩබ්පී ආර්එස්පී යූඑස්පී පීඑස්සී - යුද්ධ හමුදා මූලස්ථානයේ ජනමාධ්‍ය අධ්‍යක්ෂ මණ්ඩලයේ අධ්‍යක්ෂ තනතුර අත් හැරීම හා 23 වන සේනාංකයේ කාර්ය නියුක්ත සේනාංකාධිපති වශයෙන් පත් කිරීම

ඌ. 2006 ජනවාරි මස 02 වැනි දින සිට :-

(1) බ්‍රිගේඩියර් ඩීඑම්ඩී අල්විස් යූඑස්පී පීඑස්සී - සාම සම්බන්ධීකරණ මහලේකම් කාර්යාලයේ අධ්‍යක්ෂ ක්‍රියාන්විත තනතුර අත් හැරීම

(2) බ්‍රිගේඩියර් ඊපීද ඉසෙඩ් අබේසේකර යූඑස්පී - සාම සම්බන්ධීකරණ මහලේකම් කාර්යාලයේ අධ්‍යක්ෂ ක්‍රියාන්විත වශයෙන් පත් කිරීම

එ. 2006 ජනවාරි මස 05 වැනි දින සිට :-

(1) මේජර් ජෙනරාල් පී චන්ද්‍රවංශ ආර්ඩබ්පී ආර්එස්පී යූඑස්පී පීඑස්සී - මෙහෙයුම් ආඥාපති මූලස්ථානය - කොළඹ ආඥාපති තනතුර අත් හැරීම හා ඉදිරි නඩත්තු පෙදෙස (උතුර) ආඥාපති වශයෙන් පත් කිරීම

ඒ. 2006 ජනවාරි මස 06 වැනි දින සිට :-

(1) මේජර් ජෙනරාල් ඩීවීඑස්වයි කුලතුංග ආර්එස්පී යූඑස්පී එන්ඩීසී පීඑස්සී - අණ හා මාණ්ඩලික විද්‍යාලයේ සේනාවිධායක තනතුර අත් හැරීම හා ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බලසේනා මූලස්ථානයේ සේනාවිධායක වශයෙන් පත් කිරීම

(2) බ්‍රිගේඩියර් ඒඩබ්ජේසී ද සිල්වා ආර්ඩබ්පී යූඑස්පී පීඑස්සී - අණ හා මාණ්ඩලික විද්‍යාලයේ කාර්ය නියුක්ත සේනාවිධායක වශයෙන් පත් කිරීම

ඔ. 2006 ජනවාරි මස 10 වැනි දින සිට :-

(1) බ්‍රිගේඩියර් එන්ජ්ජේසී ඩයස් ආර්ඩබ්පී ආර්එස්පී - 56 වන සේනාංකයේ කාර්ය නියුක්ත සේනාංකාධිපති වශයෙන් පත් කිරීම

අතිගරු ජනාධිපතිතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී ආර්එස්පී යූඑස්පී,<br>
ලේකම්,<br>
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,<br>
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2006 ජනවාරි මස 13 වැනි දින,<br>
කොළඹ දී ය.

07-386/4

---

2006 අංක 163

D/RF/RECT/770(XV).

## ශ්‍රී ලංකා යුද්ධ හමුදාව-ස්ථිර බල හමුදාව

### අතිගරු ජනාධිපතිතුමාණන් විසින් අනුමත කරන ලද නිළ ස්ථිර කිරීම්

(1) පහත නම් සඳහන් ජ්‍යෙෂ්ඨ නිලධාරීන් 2005 ජූලි මස 03 වැනි දින සිට බ්‍රිගේඩියර් නිලයෙහි ස්ථිර කිරීම අතිගරු ජනාධිපතිතුමාණන් විසින් අනුමත කර ඇත.

අ. කර්නල් (තාවකාලික බ්‍රිගේඩියර්) ජගත් ජයසූරිය යූඑස්පී පීඑස්සී
ආ. කර්නල් (තාවකාලික බ්‍රිගේඩියර්) මල්වත්තගේ චන්දිම මෙන්ඩක පෙරේරා සමරසිංහ, ආර්ඩබ්පී ආර්එස්පී යූඑස්පී පීඑස්සී
ඇ. කර්නල් (තාවකාලික බ්‍රිගේඩියර්) රොහාන් මහේෂ් ජයසිංහ, යූඑස්පී පීඑස්සී
ඈ. කර්නල් (තාවකාලික බ්‍රිගේඩියර්) අහමඩ් රිසුයින් සැකි, යූඑස්පී එල්එස්සී
ඉ. කර්නල් (තාවකාලික බ්‍රිගේඩියර්) කුරුකුලසූරිය අප්පුතන්තිරිගේ නිහාල් සුනිල් කැල්වින් ඇලෙක්සැන්ඩර් ධර්මරත්න
ඊ. කර්නල් (තාවකාලික බ්‍රිගේඩියර්) හර්ෂ ලක්ෂ්මන් වීරතුංග, යූඑස්පී එල්එස්සී
උ. කර්නල් (තාවකාලික බ්‍රිගේඩියර්) ජන්මික ජගච්චන්ද්‍රනාත් ප්‍රතාපසිංහ සේනාපති තල්අරබේ ලියනගේ, ආර්එස්පී යූඑස්පී අයිජී

2. පහත නම් සඳහන් ජ්‍යෙෂ්ඨ නිලධාරීන් 2005 සැප්තැම්බර් මස 21 වැනි දින සිට බ්‍රිගේඩියර් නිලයෙහි ස්ථිර කිරීම අතිගරු ජනාධිපතිතුමාණන් විසින් අනුමත කර ඇත.

අ. කර්නල් (තාවකාලික බ්‍රිගේඩියර්) ලක්ෂ්මන් මහේෂ් සමරවීර, ආර්ඩබ්පී ආර්එස්පී යූඑස්පී
ආ. කර්නල් (තාවකාලික බ්‍රිගේඩියර්) අකුරටියගේ ලලිත් රාජ් විජේතුංග
ඇ. කර්නල් (තාවකාලික බ්‍රිගේඩියර්) අබ්දුල් සාමාඩ් මොහොමඩ් ෂහීර් ආර්එස්පී
ඈ. කර්නල් (තාවකාලික බ්‍රිගේඩියර්) ශ්‍රීනාත් මහේන්ද්‍ර ද ආබෲව් රාජපක්ෂ, ආර්ඩබ්පී ආර්එස්පී එල්ඩීඑම්සී
ඉ. කර්නල් (තාවකාලික බ්‍රිගේඩියර්) දුක්ගන්නා රාල්ලාගේ අරුණ බණ්ඩාර ජයතිලක, ආර්ඩබ්පී ආර්එස්පී යූඑස්පී එල්ඩීඑම්සී

අතිගරු ජනාධිපතිතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2006 ජනවාරි මස 13 වැනි දින,
කොළඹ දී ය.

07-386/3

---

2006 අංක 164

අංකය ඩී/ඒඑෆ්ජ්/473.

## ශ්‍රී ලංකා ගුවන් හමුදාව

### අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කරන ලද විශ්‍රාම ගැනීමක්

2006 මාර්තු මස 15 වැනි දින සිට පහත නම සඳහන් නිලධාරියා ශ්‍රී ලංකා ගුවන් හමුදාවෙන් විශ්‍රාම ගන්නවා ඇත.

එයාර් වයිස් මාර්ෂල් ඕමතගේ දොන් නිලංජන් ලාල් පෙරේරා (01196) - කාර්/ඉංජී

අතිගරු ජනාධිපතිතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2006 පෙබරවාරි මස 21 වැනි දින,
කොළඹ දී ය.

07-388

---

2006 අංක 165

අංකය ඩී/ඒඑෆ්ජ්/9/1.

## ශ්‍රී ලංකා ගුවන් හමුදාව

### අතිගරු ජනාධිපතිතුමාණන් විසින් අනුමත කරන ලද උසස් කිරීම්

පහත නම් සඳහන් නිලධාරීන් ඔවුන්ගේ නම්වලට ඉදිරියෙන් දක්වා ඇති දින සිට තාවකාලික ගෲප් කැප්ටන් නිලයට උසස් කෙරේ.

විංග් කමාන්ඩර් අජිත් ප්‍රේමලාල් අබේසේකර (01378) ගු. තො. නි. - 2004.06.01
විංග් කමාන්ඩර් කුරුකුලසූරිය ප්‍රැන්සිස් රෝහිත ප්‍රනාන්දු (01400) පාලන/රෙජී - 2004.11.18
විංග් කමාන්ඩර් ආරියමාලතී දේවාලෙගම ගමාචාරි (OW/01006) පාලන/නීති - 2005.01.01
විංග් කමාන්ඩර් ජනක් ප්‍රසන්න වනිගතුංග (01416) කාර්/සංඥා - 2005.03.01

අතිගරු ජනාධිපතිතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2006 අප්‍රේල් මස 24 වැනි දින,
කොළඹ දී ය.

07-389

2006 අංක 166

අංකය ඩී/ඒඑෆ්/527.

### ශ්‍රී ලංකා ගුවන් හමුදාව

### අතිගරු ජනාධිපතිතුමාණන් විසින් අනුමත කරන ලද විශ්‍රාම ගැනීමක්

2006 ජුනි මස 20 වැනි දින සිට පහත නම සඳහන් නිලධාරියා ශ්‍රී ලංකා ගුවන් හමුදාවෙන් විශ්‍රාම ගන්නවා ඇත.

විං කමාන්ඩර් තිලකරත්න මුදියන්සෙලාගේ සමන් ප්‍රසන්න තිලකරත්න (01548) - උපකරණ

අතිගරු ජනාධිපතිතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2006 පෙබරවාරි මස 22 වැනි දින,
කොළඹ දී ය.

07-387

---

2006 අංක 167

අංකය ඩී/ඒඑෆ්/533.

### ශ්‍රී ලංකා ගුවන් හමුදාව

### අතිගරු ජනාධිපතිතුමාණන් විසින් අනුමත කරන ලද අධිකාරියෙන් ඉල්ලා අස්වීමක්

2006 ජුනි මස 01 වැනි දින සිට ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ පහත නම සඳහන් නිලධාරිණිය අධිකාරයෙන් ඉල්ලා අස්වීම අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කර ඇත.

ස්කොඩ්රන් ලීඩර් තුෂිරා නිලන්ති දිසානායක (01930) - දන්ත

අතිගරු ජනාධිපතිතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2006 අප්‍රේල් මස 24 වැනි දින,
කොළඹ දී ය.

07-392

---

2006 අංක 168

අංකය ඩී/ඒඑෆ්/වී/67.

### ශ්‍රී ලංකා ස්වේච්ඡා ගුවන් හමුදාව

### අතිගරු ජනාධිපතිතුමාණන් විසින් අනුමත කරන ලද අධිකාරියෙන් ඉල්ලා අස්වීම

2006 මාර්තු මස 31 වැනි දින සිට පහත නම සඳහන් නිලධාරියාගේ ශ්‍රී ලංකා ස්වේච්ඡා ගුවන් හමුදා සේවයෙන් ඉල්ලා අස්වීම අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කර ඇත

| *නිළය* | *සම්පූර්ණ නම සහ සේවා අංකය* | *ශාඛාව* |
|---|---|---|
| බලපංති ලුතිනන් | තන්ඩුල සම්පත් විපුලගුණ (ස්/0486) | ගු. තො. නි |

අතිගරු ජනාධිපතිතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2006 මාර්තු මස 29 වැනි දින,
කොළඹ දී ය.

07-393

---

2006 අංක 169

අංකය ඩී/ඒඑෆ්/වී/70.

### ශ්‍රී ලංකා ස්වේච්ඡා ගුවන් හමුදාව

### අතිගරු ජනාධිපතිතුමාණන් විසින් අනුමත කරන ලද අධිකාරියෙන් ඉල්ලා අස්වීම

2006 මාර්තු මස 31 වැනි දින සිට පහත නම සඳහන් නිලධාරියා ශ්‍රී ලංකා ස්වේච්ඡා ගුවන් හමුදා සේවයෙන් ඉල්ලා අස්වීම අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කර ඇත.

| *නිළය* | *සම්පූර්ණ නම සහ සේවා අංකය* | *ශාඛාව* |
|---|---|---|
| බලසන නායක | වීරසේකර අච්චිල්ලාගේ මලල සූර්යබණ්ඩාර විරසේකර මහාසේන අභය සේනානායක (ස්/0465) | ගු. තො. නි |

අතිගරු ජනාධිපතිතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2006 අප්‍රේල් මස 09 වැනි දින,
කොළඹ දී ය.

07-391

2006 අංක 170

අංකය ඩී/ඒඑෆ්/වී/68.

### ශ්‍රී ලංකා ස්වේච්ඡා ගුවන් හමුදාව

### අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කරන ලද අධිකාරියෙන් ඉල්ලා අස්වීම

2006 මාර්තු මස 31 වැනි දින සිට පහත නම සඳහන් නිලධාරියාගේ ශ්‍රී ලංකා ස්වේච්ඡා ගුවන් හමුදා සේවයෙන් ඉල්ලා අස්වීම අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කර ඇත.

| *නිලය* | *සම්පූර්ණ නම සහ සේවා අංකය* | *ශාඛාව* |
|---|---|---|
| බලපති ලුතිනන් | පනාවල විදානලාගේ ජගත් පනාවල (ස්/0485) | ගු. තො. නි |

අතිගරු ජනාධිපතිතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2006 මාර්තු මස 29 වැනි දින,
කොළඹ දී ය.

07-394

2006 අංක 171

අංකය ඩී/ඒඑෆ්/වී/69.

### ශ්‍රී ලංකා ස්වේච්ඡා ගුවන් හමුදාව

### අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කරන ලද අධිකාරියෙන් ඉල්ලා අස්වීම

2006 මාර්තු මස 31 වැනි දින සිට පහත නම සඳහන් නිලධාරියාගේ ශ්‍රී ලංකා ස්වේච්ඡා ගුවන් හමුදා සේවයෙන් ඉල්ලා අස්වීම අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කර ඇත.

| *නිලය* | *සම්පූර්ණ නම සහ සේවා අංකය* | *ශාඛාව* |
|---|---|---|
| පියසර නිලධාරී | සනත් චන්ද්‍රා අත්තනායක (ස්/0455) | ගු. තො. නි |

අතිගරු ජනාධිපතිතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2006 මාර්තු මස 29 වැනි දින,
කොළඹ දී ය.

07-390

## අමාත්‍ය මණ්ඩලය විසින් කරන ලද පත්කිරීම් ආදිය

2006 අංක 172

අමාත්‍ය මණ්ඩලය විසින් පහත සඳහන් පත්වීම කර ඇත :–

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ I වන පන්තියේ, එස්. එස්. හෙට්ටිආරච්චි මහතා, 2006 ජනවාරි මස 09 දින සිට ක්‍රියාත්මක වන පරිදි නැවත නියමයක් කරන තුරු නිපුණතා සංවර්ධන හා රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්, වශයෙන්,

07-322/1

---

2006 අංක 173

අමාත්‍ය මණ්ඩලය විසින් පහත සඳහන් පත්වීම කර ඇත :–

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ I වන පන්තියේ, එච්. එම්. එස්. ජයතුංග මහත්මිය 2006 ජනවාරි මස 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි නැවත නියමයක් කරනතුරු අග්‍රාමාත්‍ය කාර්යාලයේ ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් වශයෙන්

07-321/1

2006 අංක 174

අමාත්‍ය මණ්ඩලය විසින් පහත සඳහන් පත්වීම කර ඇත :–

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ I වන පන්තියේ, ටී. එම්. එල්. සී. සේනාරත්න මහත්මිය 2006 මාර්තු මස 04 දින සිට ක්‍රියාත්මක වන පරිදි නැවත නියමයක් කරනතුරු නිපුණතා සංවර්ධන හා රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශයේ අතිරේක ලේකම් වශයෙන්,

07-322/3

---

2006 අංක 175

අමාත්‍ය මණ්ඩලය විසින් පහත සඳහන් පත්වීම කර ඇත :–

ඒ. ඒ. විජේපාල මහතා, 2006 මාර්තු මස 27 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි නැවත නියමයක් කරනතුරු දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් වශයෙන්,

07-323/3

2006 අංක 176

අමාත්‍ය මණ්ඩලය විසින් පහත සඳහන් පත්වීම කර ඇත :–

ජී. ඩබ්ලිව්. සේනාරත්න මහතා, 2006 අප්‍රේල් මස 01 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි නැවත නියමයක් කරන තුරු තක්සේරු දෙපාර්තමේන්තුවේ ප්‍රධාන තක්සේරුකරු වශයෙන්.

07-323/2

---

2006 අංක 177

අමාත්‍ය මණ්ඩලය විසින් පහත සඳහන් පත්වීම කර ඇත :–

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ I වන පන්තියේ, ජී. බී. එම්. මහින්ද මොරගොල්ල මහතා, වහාම ක්‍රියාත්මක වන පරිදි නැවත නියමයක් කරන තුරු අග්‍රාමාත්‍ය කාර්යාලයේ අතිරේක ලේකම් වශයෙන්.

07-321/2

2006 අංක 178

අමාත්‍ය මණ්ඩලය විසින් පහත සඳහන් පත්වීම කර ඇත :–

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ I වන පන්තියේ, ඩබ්ලිව්. එම්. බන්දුසේන මහතා වහාම ක්‍රියාත්මක වන පරිදි නැවත නියමයක් කරනතුරු නිපුණතා සංවර්ධන හා රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශයේ අතිරේක ලේකම් වශයෙන්.

07-322/2

---

2006 අංක 179

අමාත්‍ය මණ්ඩලය විසින් පහත සඳහන් පත්වීම කර ඇත :–

ශ්‍රී ලංකා ක්‍රම සම්පාදන සේවයේ I වන පන්තියේ දමිතා ද සොයිසා මහත්මිය වහාම ක්‍රියාත්මක වන පරිදි නැවත නියමයක් කරන තුරු සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් වශයෙන්,

07-323/1

---

2006 අංක 180

අමාත්‍ය මණ්ඩලය විසින් පහත සඳහන් පත්වීම කර ඇත :–

එස්. ආර්. ආටිගල මහතා, වහාම ක්‍රියාත්මක වන පරිදි නැවත නියමයක් කරනතුරු රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් වශයෙන්.

07-323/4

---

# ආණ්ඩුවේ නිවේදන

එල්. ඩී. බී. 277/40.

## (188 වන අධිකාරය වූ) පුරාවස්තු ආඥාපනත

### නිවේදනයයි

(188 වැනි අධිකාරය වූ) පුරාවස්තු ආඥාපනතේ 33 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, පුරාවිද්‍යා අධ්‍යක්ෂ ජනරාල් දිසානායක මුදියන්සේලාගේ සෙනරත් බණ්ඩාර වන මම මෙහි උපලේඛනයේ නිශ්චිතව සඳහන් රජයේ ඉඩම, ඉඩම් කොමසාරිස්වරයාගේ අනුමැතිය ඇතිව ඒ ආඥාපනතේ කාර්යය සඳහා පුරාවිද්‍යා රක්ෂිතයක් විය යුතු බව මෙම නිවේදනයෙන් ප්‍රකාශ කරමි.

සෙනරත් දිසානායක,
පුරාවිද්‍යා අධ්‍යක්ෂ ජනරාල්.

2006 ජුනි මස 30 වැනි දින,
කොළඹ දී ය.

### උපලේඛනය

සබරගමුව පළාතේ, රත්නපුර දිස්ත්‍රික්කයේ, කොළොන්න ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ, මඩුවන්වල ග්‍රාම නිලධාරි වසමේ පිහිටි ග. පි. 883 අතිරේක පත්‍ර අංක 4 දරන පිඹුරේ කැබලි අංක 104 පෙන්නුම් කොට ඇති අක්කර 7, රූ. 0, පර්. 23 ක විශාලත්වයෙන් යුත් මඩුවන්වල වලව්ව පිහිටි ඉඩම් කොටස.

07-330

---

## මාතර බිනර මහා පෙරහැර

දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, පවත්වනු ලබන 2006 බිනර මහ පෙරහැර 2006 සැප්තැම්බර් මස 07 වැනි දින පවත්වනු ලබන බව වන්දනා ගමන් ආඥාපනත යටතේ (175 පරිච්ඡේදයේ) 1959 නොවැම්බර් මස 20 වැනි දින නිකුත් කරන ලද 11959 දරන ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරන ලද රෙගුලාසිවල 10 වැනි වගන්තිය යටතේ මෙයින් දන්වමි.

ඩබ්. කේ. කේ. අතුකෝරල,
ප්‍රාදේශීය ලේකම්,
මාතර.

2006 ජුලි මස 04 වැනි දින,
මාතර ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයේ දී ය.

07-344

## වන්දනා ගමන් ආඥාපනත

### ශ්‍රී මාමාංග පිල්ලයාර් කෝවිල් වාර්ෂික උත්සවය - 2006 මඩකලපුව දිස්ත්‍රික්කය

යථොක්ත උත්සවය 2006 ජූලි මස 15 වැනි දින පටන් ගෙන 2006 ජූලි මස 24 වැනි දින දක්වා පවත්වනු ලබන බව මෙහි උත්සවයට වන්දනා සඳහා පැමිණෙන අයගේ සහ අනෙකුත් සියලු දෙනාගේම දැන ගැනීම සඳහා මෙයින් ප්‍රකාශ කරමි.

1948.07.16 වැනි දින අංක 9886 දරන ආණ්ඩුවේ *ගැසට් නිවේදනයේ* සඳහන් නිත්‍ය නියෝගයක් කෙරෙහි මෙම උත්සව සමයේදී එකී උත්සවයට පැමිණෙන සියල්ලන්ගෙන් හා අනෙකුත් අයගෙන් අවධානය මෙයින් යොමු කරවමි.

එස්. ශ්‍රීස්කාන්තා,<br>
පරිපාලන නිලධාරී,<br>
මන්මුනේ උතුර-මඩකලපුව.

07-338

## වන්දනා ගමන් ආඥාපනත (175 වැනි අධිකාරය)

### ගැටබරුව රජමහා විහාරස්ථානයේ වාර්ෂික ඇසළ උත්සවය - 2006

මාතර දිස්ත්‍රික්කයේ, කොටපොල ප්‍රාදේශීය මහලේකම් කොට්ඨාශයේ ඓතිහාසික ගැටබව රජමහා විහාරස්ථානයේ ඇසළ උත්සවය, 2006 සැප්තැම්බර් මස 03 වැනි දින සිට 09 වැනි දින දක්වා පවත්වනු ලබන බව (176 වන අධිකාරිය වූ) වන්දනා ගමන් ආඥාපනත යටතේ 1988 මාර්තු මස 31 වැනි දින නිකුත් කරන ලද අංක 500 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* I වැනි කොටස I ඡේදයේ (සාමාන්‍ය) ප්‍රසිද්ධ කරන ලද රෙගුලාසි යටතේ මෙයින් දන්වමි.

ඩී. ඒ. ඒකනායක,<br>
ප්‍රාදේශීය ලේකම්-කොටපොල.

2006 ජූලි මස 03 වැනි දින,<br>
කොටපොල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

07-404

# විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

## සීමාසහිත සෙලාන් බැංකුව - රත්නපුර ශාඛාව

### 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අත්කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ සීමාසහිත සෙලාන් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද සම්මුතිය

ගිණුම් : අංකය 0070-00052296-001.

සීමාසහිත සෙලාන් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2006.06.21 දින පවත්වන්නට යෙදුනු රැස්වීමේදී 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වන වගන්තිය යටතේ විශේෂයෙන් සහ ඒකමතිකව පහත සඳහන් අයුරු සම්මත කර ගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

සීමාසහිත සෙලාන් බැංකුව නමට ලියන ලද ප්‍රසිද්ධ නොතාරිස් කේ. එස්. අබේරත්න විසින් සහතික කරන ලද 1994 මාර්තු මස 23 දිනැති අංක 1208, 1999 අගෝස්තු මස 12 දිනැති අංක 2073, 1999 නොවැම්බර් මස 08 දිනැති අංක 2127 සහ 2000 මාර්තු 09 දිනැති අංක 2189 දරන බැඳුම්කර මත අයවිය යුතු මුදල් ගෙවීම, රත්නපුරයෙහි සිය ලියාපදිංචි කාර්යාලය පිහිටා ඇති සහ 1982 අංක 17 දරන සමාගම් පනත යටතේ සංස්ථාපිත සමාගමක් වන සමන් එළිය වීස් ප්‍රයිවට් ලිමිටඩ් යන අය බන්ධනදායී වශයෙන් පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරය යටතේ රුපියල් පන්කෝටි විසි අටලක්ෂ එකොලොස් දහස් තුන්සිය අසූ පහයි ශත හැත්තෑහතරක් (රු. 5,28,11,385.74) මුදලක් 2005 දෙසැම්බර් මස 31 වැනි දින වන විට සීමාසහිත සෙලාන් බැංකුවට ලැබිය යුතුව සහ අයවිය යුතුව ඇති හෙයින් ද එකී රු. 5,28,11,385.74 මුදල ද, 2006 ජනවාරි මස 01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට, එම මුදලට වර්ෂයකට සියයට තිස් දෙක (32%) බැගින් වූ පොළිය සමඟ ප්‍රසිද්ධ කිරීමේ වියදම් සහ දරන්නට යෙදුනු වෙනත් ගාස්තු ද තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (ඇත්නම්) එම මුදල අඩුකර අයකර ගැනීම පිණිස ඉහත කී අංක 1208, 2073, 2127 සහ 2189 දරන බැඳුම්කර මගින් සීමාසහිත සෙලාන් බැංකුව වෙත උකස් කර ඇත්තාවූ මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇති දේපළ සහ පරිශ්‍රය බලයලත් වෙන්දේසිකාර අයි. ඩබ්ලිව්. ජයසූරිය මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත මගින් පැවරී ඇති බලතල අනුව සීමාසහිත සෙලාන් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරනු ලැබේ.

#### උපලේඛනය

1. සබරගමුව පළාතේ, රත්නපුර දිස්ත්‍රික්කයේ, කුරුවිටි කෝරළේ, උඩපත්තු දකුණ දීයගල ගමේ පිහිටි බලයලත් මිනින්දෝරු එෆ්. සී. ඩී. හෙට්ටිආරච්චි විසින් සාදන ලද 1992 සැප්තැම්බර් මස 09 දිනැති අංක 2176ඒ දරන සැලැස්මේ සඳහන් කානි එස්ටේට් හි කොටසක් යනුවෙන් (එෆ්ව්පී 397හි සඳහන් කැබැලි අංක 84 හි කොටසක්) හඳුන්වනු ලබන ඉඩමේ කැබලි අංක 1සේ පෙන්නුම් කරනු ලබන බෙදා වෙන් කළ ඉඩමේ කොටසට මායිම්, උතුරට : මෙම ඉඩමේ ඉතිරි කොටස ද, නැගෙනහිරට : එස්ටේට් පාර ද, දකුණට : මෙම ඉඩමේ ඉතිරි කොටස සහ බස්නාහිරට : මෙම ඉඩමේ ඉතිරි කොටස ද යන මායිම් තුළ අක්කර තුනයි පර්චස් විසිපහක් (අ. 3, රූ. 0, පර්. 25) විශාල, ගොඩනැගිලි, වගා සහ එහි පිහිටි වෙනත් සියලු දේ සමඟ ඉඩම. මෙය රත්නපුර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ කාණ්ඩය සහ පත්‍රිරුව ඒ 593/231 යටතේ ලියාපදිංචි කර ඇත.

2. පෙර කී කුරුවිටි කෝරළේ, උඩපත්තු දකුණ දීයගල ගමේ පිහිටි බලයලත් මිනින්දෝරු එෆ්. සී. ඩී. හෙට්ටිආරච්චි විසින් සාදන ලද 1992 සැප්තැම්බර් මස 09 දිනැති අංක 2176ඒ දරන සැලැස්මේ සඳහන් කානි එස්ටේට්හි කොටසක් යනුවෙන් (එෆ්ව්පී 397හි සඳහන් කැබලි අංක 84හි කොටසක්) හඳුන්වනු ලබන ඉඩමේ කැබලි අංක 2 සේ පෙන්නුම් කරනු ලබන බෙදා වෙන් කළ ඉඩමේ කොටසට මායිම්, උතුරට : මෙම ඉඩමේ ඉතිරි කොටස ද, නැගෙනහිරට : කොරවත්තේ ඇල ද, දකුණට : මෙම ඉඩමේ ඉතිරි කොටස සහ බස්නාහිරට : එස්ටේට් පාර ද යන මායිම් තුළ එකී අංක 2176ඒ දරන සැලැස්ම අනුව අක්කර එකයි රූඩ් තුනයි පර්චස් පහළොවක් (අ. 1, රූ. 3, පර්. 15) විශාල, වගා සහ එහි පිහිටි වෙනත් සියලු දේ සමඟ ඉඩම. මෙය රත්නපුර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ කාණ්ඩය සහ පත්‍රිරුව ඒ 593/232හි ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සී. කොටිගල,<br>
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී-නීති.

07-367/4

## රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

### 1981 අංක 62 දරන පනතින් හා 1984 හි අංක 29 දරන පනතින් සංශෝධිත පරිදි 1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය යටතේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගැණුනු යෝජනාව

ණය අංකය : 18/59695/වයි18/240.

රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය 2001.10.24 දින පැවැත්වුණු රැස්වීමේ දී පහත සඳහන් අයුරු විශේෂයෙන් හා ඒකමතිකව තීරණය කරන ලදී :

1. කුලියාපිටිය ප්‍රසිද්ධ නොතාරිස් ඒ. එම්. ජී. ප්‍රේමචන්ද්‍ර විසින් සහතික කරන ලද 1996.11.08 දින හා අංක 2482 දරන උකස් බැඳුම්කරය මත අය විය යුතු මුදල් ගෙවීම කටුගම්පොල පදිංචි වීරසිංහ මුදියන්සේලාගේ විමලසිරි සරත්චන්ද්‍ර සහ වීරසිංහ ආරච්චිලාගේ සුනීතා වීරසිංහ යන අය විසින් පැහැර හැර ඇති බැවින් ද, 2001.08.20 දිනට මුල් ණය මුදල හා එය මත පොළී වශයෙන් රුපියල් එක්ලක්ෂ හැත්තෑ තුන්දහස් අටසිය අසූ හතයි ශත හත (රු. 1,73,887.07) මුදලක් ද, පූර්වෝක්ත බැඳුම්කර අංක 2482 ප්‍රකාර ගෙවිය යුතු මුදල සම්පූර්ණයෙන් ගෙවා නිමකරන දිනය වනතුරු දිනකට රුපියල් හැත්තෑ පහයි ශත හැත්තෑඑක (රු. 75.71) බැගින් වැඩිපුර පොළී ද අයවිය යුතුව ඇති බැවින් ද,

2. මෙම දැන්වීමේ පළමුවන ඡේදයේ දක්වා ඇති එකී මුදල සහ 1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 57 වැනි වගන්තිය යටතේ අය කර ගත යුතුව ඇති වියදම් හා මුදල් ආපසු අයකර ගැනීම උදෙසා මෙහි පහත උපලේඛනයේ විස්තර කර ඇති හා රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවට උකස්කර ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම සඳහා සංශෝධන සහිත 1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය ප්‍රකාර, කුරුණෑගල, මල්කඩුවාව, වටරවුම් පාර, ගම්මඩුගොල්ල මාවත, අංක 15හි බලයලත් වෙන්දේසිකාර බී. එම්. ඒ. විජයතිලක මහතාට බලය පැවරිය යුතු වන්නේය.

#### උපලේඛනය

කුරුණෑගල දිස්ත්‍රික්කයේ, පන්නල ප්‍රාදේශීය සභා සීමාවේ කටුගම්පොල ගම්මානයේ පිහිටි බුලත්ඇලවත්ත *හෙවත්* අලුසැල්පිටිය නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එච්. ඒ. එම්. සී. බණ්ඩාර විසින් සකසන ලද 1995.03.10 දිනැති හා අංක 1242 දරන මිණුම් පිඹුරේ කැබලි අංක 2 ලෙස දැක්වෙන ප්‍රමාණයෙන් අ. 1, රූ. 1, පර්. 26.5ක් වූ බෙදා වෙන් කළ බිම් කොටස සහ ඒ මත පිහිටි සියලු දේත් සමඟ වේ.

ඩබ්. ඩී. මෙන්ඩිස්,
*වැඩ බලන සාමාන්‍යාධිකාරී.*

2006 ජූලි මස 07 වැනි දින,
අංක 269, ගාලු පාර,
කොළඹ 03.

07-384/2

## රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

### 1981 අංක 62 දරන පනතින් හා 1984 හි අංක 29 දරන පනතින් සංශෝධිත පරිදි 1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය යටතේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගැණුනු යෝජනාව

ණය අංකය : එස්-1/26835/පීජ්1/417, 1/46305/සීඩී8/247.

රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය 2005.11.14 දින පැවැත්වුණු රැස්වීමේ දී පහත සඳහන් අයුරු විශේෂයෙන් හා ඒකමතිකව තීරණය කරන ලදී :

1. කොළඹ ප්‍රසිද්ධ නොතාරිස්වරුන් වන ඩී. ජේ. ටී. ජී. ආර්. ද වාස් සහ අයි ජී. අබේසිංහ විසින් සහතික කරන ලද 1995.10.12 සහ 2003.12.05 දින හා අංක 130 සහ 8904 දරන උකස් බැඳුම්කර මත අය විය යුතු මුදල් ගෙවීම පොල්ගස්ඕවිට පදිංචි ජයතිලක ධර්මකීර්ති ලංකාධිකාරි රාජගුරු සුබපණ්ඩිත මුදියන්සේලාගේ විජිත ධර්මරාජගුරු ජයතිලක යන අය විසින් පැහැර හැර ඇති බැවින් ද, 2005.10.12 දිනට මුල් ණය මුදල හා එය මත පොළී වශයෙන් රුපියල් දෙලක්ෂ හැත්තෑ නව දහස් නවසිය හැත්තෑ හතයි ශත අනූ තුන (රු. 2,79,977.93) මුදලක් ද, පූර්වෝක්ත බැඳුම්කර අංක 130 සහ 8904 ප්‍රකාර ගෙවිය යුතු මුදල සම්පූර්ණයෙන් ගෙවා නිමකරන දිනය වනතුරු දිනකට රුපියල් අසූ නවයයි ශත හැටනවය (රු. 89.69) බැගින් වැඩිපුර පොළී ද අයවිය යුතුව ඇති බැවින් ද,

2. මෙම දැන්වීමේ පළමුවන ඡේදයේ දක්වා ඇති එකී මුදල සහ 1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 57 වැනි වගන්තිය යටතේ අය කර ගත යුතුව ඇති වියදම් හා මුදල් ආපසු අයකර ගැනීම උදෙසා මෙහි පහත උපලේඛනයේ විස්තර කර ඇති හා රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවට උකස්කර ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම සඳහා සංශෝධන සහිත 1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය ප්‍රකාර, බොරලැස්ගමුව, ඇඹිල්ලවත්ත පාර, කටුවාවල, තුන්වෙනි පටුමඟ, අංක 21/10ඒහි බලයලත් වෙන්දේසිකාර එෆ්. ආර්. ගල්හේන මහතාට බලය පැවරිය යුතු වන්නේය.

#### උපලේඛනය

කොළඹ දිස්ත්‍රික්කයේ, හෝමාගම ප්‍රාදේශීය සභා සීමාවේ වැතර උප කාර්යාලයේ සියඹලාගොඩ පිහිටි වැලිහේන නමැති ඉඩමේ බලයලත් මිනින්දෝරු එස්. ඩී. සරත්චන්ද්‍ර විසින් සකසන ලද 1995.02.16 දින සහ අංක 934 දරන මිණුම් පිඹුරේ කැබලි අංක 53බී ලෙස දැක්වෙන ප්‍රමාණයෙන් අ. 0, රූ. 0, පර්. 10.40ක් වූ බෙදා වෙන් කළ බිම් කොටස සහ ඒ මත පිහිටි සියලු දේත් සමඟ වේ.

තවද, පිඹුරු අංක 2658හි කැබලි අංක ඩී මතින් (අඩි 20 පළල) වැටී ඇති මාර්ග අයිතිය ද සමඟ වේ.

ඩබ්. ඩී. මෙන්ඩිස්,
*වැඩ බලන සාමාන්‍යාධිකාරී.*

2006 ජූලි මස 07 වැනි දින,
අංක 269, ගාලු පාර,
කොළඹ 03.

07-384/1

## රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

### 1981 අංක 62 දරන පනතින් හා 1984 හි අංක 29 දරන පනතින් සංශෝධිත පරිදි 1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය යටතේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගැණුනු යෝජනාව

ණය අංකය : 2/70951/බී2/679.

රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය 2003.07.17 දින පැවැත්වුණු රැස්වීමේ දී පහත සඳහන් අයුරු විශේෂයෙන් හා ඒකමතිකව තීරණය කරන ලදී :

1. කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් වයි. ඒ. ඩී. එන්. ඒ. විජේරත්න විසින් සහතික කරන ලද 2000.08.05 දින හා අංක 3985 දරන උකස් බැඳුම්කරය මත අය විය යුතු මුදල් ගෙවීම වත්තල පදිංචි සෙනරත් මුදලිගේ දුලීප හසංක පෙරේරා යන අය විසින් පැහැර හැර ඇති බැවින් ද, 2003.05.31 දිනට මුල් ණය මුදල හා එය මත පොළී වශයෙන් රුපියල් එක්ලක්ෂ අනූඅටදහස් හයසිය හැත්තෑ නවයයි ශත හැට (රු. 1,98,679.60) මුදලක් ද, පූර්වෝක්ත බැඳුම්කර අංක 3985 ප්‍රකාර ගෙවිය යුතු මුදල සම්පූර්ණයෙන් ගෙවා නිමකරන දිනය වනතුරු දිනකට රුපියල් අසූපහයි ශත විසිහතර (රු. 85.24) බැගින් වැඩිපුර පොළී ද අයවිය යුතුව ඇති බැවින් ද,

2. මෙම දැන්වීමේ පළමුවන ඡේදයේ දක්වා ඇති එකී මුදල සහ 1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 57 වැනි වගන්තිය යටතේ අය කර ගත යුතුව ඇති වියදම් හා මුදල් ආපසු අයකර ගැනීම උදෙසා මෙහි පහත උපලේඛනයේ විස්තර කර ඇති හා රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවට උකස්කර ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම සඳහා සංශෝධන සහිත 1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය ප්‍රකාර, ගම්පහ. උසාවිය පාර, ස. ණ. ස. චතුරශ්‍රය, අංක 15හි බලයලත් වෙන්දේසිකාර ටී. එම්. එස්. පීරිස් මහතාට බලය පැවරිය යුතු වන්නේය.

#### උපලේඛනය

ගම්පහ දිස්ත්‍රික්කයේ, කටාන ප්‍රාදේශීය සභා සීමාවේ කිඹුලාපිටිය පිහිටි ඉද්දගොඩැල්ල නමැති ඉඩමේ බලයලත් මිනින්දෝරු බී. එස්. නානායක්කාර විසින් 1999.09.07 දින සකසන ලද අංක 1107 දරන මිණුම් පිඹුරේ කැබලි අංක 8 ලෙස දක්වා ඇති ප්‍රමාණයෙන් අ. 0, රූ. 0, පර්. 13.5ක් වූ බෙදා වෙන් කරන ලද බිම් කොටස සහ ඒ මත පිහිටි සියලු දේත් සමඟ වේ.

තවද එකී අංක 1107 දරන පිඹුරේ කැබලි අංක 6 සහ 13 මගින් දක්වා ඇති මාර්ග අයිතිය සහ ඩබ්. එස්. පෙරේරා බලයලත් මානක තැන විසින් 1995.03.04 දින සහ අංක 2761 දරන පිඹුරේ දක්වා ඇති මාර්ග අයිතින්ද සමඟ වේ.

ඩබ්. ඩී. මෙන්ඩිස්,
*වැඩ බලන සාමාන්‍යාධිකාරී.*

2006 ජූලි මස 07 වැනි දින,
අංක 269, ගාලු පාර,
කොළඹ 03.

07-384/3

## රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

### 1981 අංක 62 දරන පනතින් හා 1984 හි අංක 29 දරන පනතින් සංශෝධිත පරිදි 1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය යටතේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගැණුනු යෝජනාව

ණය අංකය : කේ5/0812/කේවයි1/569.

රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය 2006.02.20 දින පැවැත්වුණු රැස්වීමේ දී පහත සඳහන් අයුරු විශේෂයෙන් හා ඒකමතිකව තීරණය කරන ලදී :

1. මාතලේ ප්‍රසිද්ධ නොතාරිස් ඒ. සී. මානික්කවේලු විසින් සහතික කරන ලද 1995.10.18 දින හා අංක 3447 දරන උකස් බැඳුම්කරය මත අය විය යුතු මුදල් ගෙවීම මාතලේ පදිංචි කරුපයියා රාජලිංගම් යන අය විසින් පැහැර හැර ඇති බැවින් ද, 2006.01.09 දිනට මුල් ණය මුදල හා එය මත පොළී වශයෙන් රුපියල් එක්ලක්ෂ අනූනවදහස් හයසිය තිස් තුනයි ශත අනූ නවය (රු. 1,99,633.99) මුදලක් ද, පූර්වෝක්ත බැඳුම්කර අංක 3447 ප්‍රකාර ගෙවිය යුතු මුදල සම්පූර්ණයෙන් ගෙවා නිමකරන දිනය වනතුරු දිනකට රුපියල් පනස් එකයි ශත දෙක (රු. 51.02) බැගින් වැඩිපුර පොළී ද අයවිය යුතුව ඇති බැවින් ද,

2. මෙම දැන්වීමේ පළමුවන ඡේදයේ දක්වා ඇති එකී මුදල සහ 1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 57 වැනි වගන්තිය යටතේ අය කර ගත යුතුව ඇති වියදම් හා මුදල් ආපසු අයකර ගැනීම උදෙසා මෙහි පහත උපලේඛනයේ විස්තර කර ඇති හා රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවට උකස්කර ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම සඳහා සංශෝධන සහිත 1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය ප්‍රකාර, කටුගස්තොට, කහල්ල, අංක 26බීහි බලයලත් වෙන්දේසිකාර කේ. බී. දහම්පත් මහතාට බලය පැවරිය යුතු වන්නේය.

#### උපලේඛනය

මාතලේ දිස්ත්‍රික්කයේ, කළුදැවල පිහිටි දික්කිරිය වත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එම්. රාජසේකරන් විසින් සැකසූ 1991.08.07 දින හා අංක 2076 දරන මිණුම් පිඹුරේ කැබලි අංක 12 ලෙස දක්වා ඇති ප්‍රමාණයෙන් අ. 0, රූ. 0, පර්. 15ක් වූ බෙදා වෙන් කළ බිම් කොටස සහ ඒ මත පිහිටි සියලු දේත් සමඟ වේ.

ඉහත පිඹුරේ වතුයායේ පාර ලෙස දැක්වෙන ප්‍රධාන මාර්ගයේ සිට වෙන් කර ඇති පාර පාවිච්චි කිරීමේ අයිතිය ද සමඟ වේ.

ඩබ්. ඩී. මෙන්ඩිස්,
*වැඩ බලන සාමාන්‍යාධිකාරී.*

2006 ජූලි මස 07 වැනි දින,
අංක 269, ගාලු පාර,
කොළඹ 03.

07-384/4

## රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

### 1981 අංක 62 දරන පනතින් හා 1984 හි අංක 29 දරන පනතින් සංශෝධිත පරිදි 1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය යටතේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගැණුනු යෝජනාව

ණය අංකය : ජීඑල්8/00675/ජීඒ1/365.

රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය 2006.05.22 දින පැවැත්වුණු රැස්වීමේ දී පහත සඳහන් අයුරු විශේෂයෙන් හා ඒකමතිකව තීරණය කරන ලදී :

1. ගාල්ල ප්‍රසිද්ධ නොතාරිස් පී. ඩබ්. සෙනෙවිරත්න විසින් සහතික කරන ලද 2004.05.17 දින හා අංක 3572 දරන උකස් බැඳුම්කරය මත අය විය යුතු මුදල් ගෙවීම හික්කඩුව පදිංචි ප්‍රසන්න ජගත් පණ්ඩිත යන අය විසින් පැහැර හැර ඇති බැවින් ද, 2006.04.28 දිනට මුල් ණය මුදල හා එය මත පොළී වශයෙන් රුපියල් හාරලක්ෂ අසූඅටදහස් පන්සිය හැට අටයි ශත හතලිස් පහ (රු. 4,88,568.45) මුදලක් ද, පූර්වෝක්ත බැඳුම්කර අංක 3572 ප්‍රකාර ගෙවිය යුතු මුදල සම්පූර්ණයෙන් ගෙවා නිමකරන දිනය වනතුරු දිනකට රුපියල් එකසිය හැටනවයයි ශත හැත්තෑ හය (රු. 169.76) බැගින් වැඩිපුර පොළී ද අයවිය යුතුව ඇති බැවින් ද,

2. මෙම දැන්වීමේ පළමුවන ඡේදයේ දක්වා ඇති එකී මුදල සහ 1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 57 වැනි වගන්තිය යටතේ අය කර ගත යුතුව ඇති වියදම් හා මුදල් ආපසු අයකර ගැනීම උදෙසා මෙහි පහත උපලේඛනයේ විස්තර කර ඇති හා රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවට උකස්කර ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම සඳහා සංශෝධන සහිත 1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය ප්‍රකාර, මාතර, කොටුව, ශ්‍රී ධර්මාරාම මාවත, අංක 14හි බලයලත් වෙන්දේසිකාර එන්. එච්. පී. එෆ්. ආරියරත්න මහතාට බලය පැවරිය යුතු වන්නේය.

### උපලේඛනය

ගාල්ල දිස්ත්‍රික්කයේ, ගාල්ල කඩවත් සතර සහ ගාල්ල මහ නගර සභා සීමාව තුළ හිරිඹුර ග්‍රාමයේ 1 වැනි පටුමගේ ජාතික නිවාස සංකීර්ණයේ වරිපනම් අංක 16හි සියඹලාගහවත්ත *හෙවත්* ගල්ඔළුවවත්ත සහ ලාවුළුගහවත්ත, කොට්ටාසගෙවත්ත, අඹුහේන සියඹලාගහවත්ත සහ බදුගෙවත්ත සහ ලෙල්ලන්ගෙවත්ත *හෙවත්* ගොඩැල්ලගෙදරවත්ත නමැති ඉඩමේ බලයලත් මිනින්දෝරු කේ. ඩබ්. පතිරණ විසින් සකසන ලද 1995.12.20 දින සහ අංක 1206 දරන මිණුම් පිඹුරේ කැබලි අංක 28 ලෙස දැක්වෙන ප්‍රමාණයෙන් අ. 0, රූ. 0. පර්. 12.3ක් වූ බෙදා වෙන් කළ බිම් කොටස සහ ඒ මත පිහි සියලු දේත් සමඟ වේ.

ඩබ්. ඩී. මෙන්ඩිස්,
*වැඩ බලන සාමාන්‍යාධිකාරී.*

2006 ජූලි මස 07 වැනි දින,
අංක 269, ගාලු පාර,
කොළඹ 03.

07-384/5

## රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

### 1981 අංක 62 දරන පනතින් හා 1984 හි අංක 29 දරන පනතින් සංශෝධිත පරිදි 1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය යටතේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගැණුනු යෝජනාව

ණය අංකය : 19/73976/වයි19/060.

රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය 2004.12.10 දින පැවැත්වුණු රැස්වීමේ දී පහත සඳහන් අයුරු විශේෂයෙන් හා ඒකමතිකව තීරණය කරන ලදී :

1. මහවැව ප්‍රසිද්ධ නොතාරිස් එස්. එම්. දෙල්ලව විසින් සහතික කරන ලද 2002.12.08 දින හා අංක 821 දරන උකස් බැඳුම්කරය මත අය විය යුතු මුදල් ගෙවීම පුත්තලම පදිංචි රාජරත්න කුමාරසිංහ යන අය විසින් පැහැර හැර ඇති බැවින් ද, 2004.11.07 දිනට මුල් ණය මුදල හා එය මත පොළී වශයෙන් රුපියල් එක්ලක්ෂ විසිදහස් නවසිය හැටහතරයි ශත දහනවය (රු. 1,20,964.19) මුදලක් ද, පූර්වෝක්ත බැඳුම්කර අංක 821 ප්‍රකාර ගෙවිය යුතු මුදල සම්පූර්ණයෙන් ගෙවා නිමකරන දිනය වනතුරු දිනකට රුපියල් හතලිස් හයයි ශත අනූතුන (රු. 46.93) බැගින් වැඩිපුර පොළී ද අයවිය යුතුව ඇති බැවින් ද,

2. මෙම දැන්වීමේ පළමුවන ඡේදයේ දක්වා ඇති එකී මුදල සහ 1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 57 වැනි වගන්තිය යටතේ අය කර ගත යුතුව ඇති වියදම් හා මුදල් ආපසු අයකර ගැනීම උදෙසා මෙහි පහත උපලේඛනයේ විස්තර කර ඇති හා රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවට උකස්කර ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම සඳහා සංශෝධන සහිත 1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය ප්‍රකාර, කෝට්ටේ, පිටකෝට්ටේ, අංක 474, මහානාම ඩ්‍රයිව්හි බලයලත් වෙන්දේසිකාර ආර්. එස්. මහානාම මහතාට බලය පැවරිය යුතු වන්නේය.

### උපලේඛනය

වයඹ පළාතේ, පුත්තලම දිස්ත්‍රික්කයේ, පුත්තලම නගර සභා සීමාවේ පුත්තලම කඩවත් සතර පුත්තලම නගර කොට්ඨාශ අංක 3හි පිහිටි අනුරාධපුර පාරේ වරිපනම් අංක 218/7 දරන වෙන්නයිකූඩිරිප්පු තොට්ටම් නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ජේ. ඒ. වී. රාජනායගම් විසින් සකසන ලද 1992.07.15 දිනැති හා අංක 72 දරන මිණුම් පිඹුරේ කැබලි අංක 1 ලෙස දැක්වෙන ප්‍රමාණයෙන් අ. 0, රූ. 1, පර්. 0ක් වූ බෙදා වෙන් කරන ලද බිම් කොටස සහ ඒ මත පිහිටි සියලු දේත් සමඟ වේ.

තවද, බලයලත් මිනින්දෝරු ජේ. ඒ. වී. රාජනායගම් විසින් සැකසුණු 2002.08.27 දින අංක 2357 දරන මිණුම් පිඹුරේ (නමුත් බලයලත් මිනින්දෝරු කේ. කනපතිපිල්ලෙයි විසින් සැකසුණු 1990.07.03 දිනැති හා පිඹුරු අංක 843 ලෙස ලියාපදිංචි කර ඇති) කැබලි අංක 1 මතින් ඇති මාර්ග අයිතීන් ද සමඟ වේ.

ඩබ්. ඩී. මෙන්ඩිස්,
*වැඩ බලන සාමාන්‍යාධිකාරී.*

2006 ජූලි මස 07 වැනි දින,
අංක 269, ගාලු පාර,
කොළඹ 03.

07-384/6

## සීමාසහිත සෙලාන් බැංකුව - අම්බලන්ගොඩ ශාඛාව

### 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ සීමාසහිත සෙලාන් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද සම්මුතිය

ගිණුම් අංකය : 0240-02510450-001.

සීමාසහිත සෙලාන් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2005.05.13 වැනි දින පවත්වන්නට යෙදුනු රැස්වීමේදී 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වන වගන්තිය යටතේ විශේෂයෙන් සහ ඒකමතිකව පහත සඳහන් අයුරු සම්මත කර ගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

සීමාසහිත සෙලාන් බැංකුව නමට ලියන ලද ප්‍රසිද්ධ නොතාරිස් ගාමිනි ඩේවිඩ් විසින් සහතික කරන ලද 2000 මැයි 09 දිනැති අංක 1804 සහ 2001 අගෝස්තු මස 28 දිනැති අංක 1972 දරන බැඳුම්කර මත අයවිය යුතු මුදල් ගෙවීම, අම්බලන්ගොඩ මෙසස් ඉරුකිරණ බුක් ඉන්ඩස්ට්‍රීස් යන නමින් ව්‍යාපාර පවත්වා ගෙන යන රූපසිංගල් ඉන්ද්‍රරත්න සිල්වා යන අය බන්ධනදායී වශයෙන් පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කර යටතේ රුපියල් දහතුන් ලක්ෂ විසිහත් දහස් එකසිය අනූ අටයි ශත අනූ හතක (රු. 13,27,198.97) මුදලක් 2004 මාර්තු මස 31 වැනි දින වන විට සීමාසහිත සෙලාන් බැංකුවට ලැබිය යුතුව සහ අයවිය යුතුව ඇති හෙයින් එකී රු. 13,27,198.97 මුදල ද, 2004 අප්‍රේල් මස 01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට, එම මුදලට වර්ෂයකට සියයට විසිහය (26%) බැගින් වූ පොලිය සමඟ ප්‍රසිද්ධ කිරීමේ වියදම් සහ දරන්නට යෙදුනු වෙනත් ගාස්තු ද තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (ඇත්නම්) එම මුදල අඩුකර අයකර ගැනීම පිණිස ඉහත කී අංක 1804 සහ 1972 දරන බැඳුම්කර මගින් සීමාසහිත සෙලාන් බැංකුව වෙත උකස් කර ඇත්තා වූ මෙහි පහත සඳහන් උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇති දේපළ බලයලත් වෙන්දේසිකාර තුසිත කරුණාරත්න මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත මගින් පැවරී ඇති බලතල අනුව සීමාසහිත සෙලාන් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරනු ලැබේ.

#### උපලේඛනය

1. දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, වැල්ලබඩ පත්තුවේ, මාදම්පේ විල්ලිගම පිහිටි පට්ටියවත්ත නමැති ඉඩමේ කැබලි අංක 3හි කැබලි අංක 3සී ලකුණු කළ බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම් උතුරට : මෙම ඉඩමේ කැබැලි අංක 3හි 3ඒ කොටස ද, නැගෙනහිරට : මෙම ඉඩමේ කැබලි අංක 3හි 3ඒ කොටස සහ මෙම ඉඩමේ කැබලි අංක 2 ද, දකුණට : ගම්සභා පාර සහ බස්නාහිරට : මෙම ඉඩමේ කැබලි අංක 3හි 3ඩී කොටස (අඩි 12ක් පළල පාර) යන මායිම් තුළ බලයලත් මිනින්දෝරු ටී. බී. ඒ. ද සිල්වා විසින් සාදන ලද 1996.02.15 දිනැති අංක 5466 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන පර්චස් තිස් අටයි දශම දෙකයි හතක් (අ. 0, රූ. 0, පර්. 38.27) විශාල ඉඩම. මෙය ගාල්ල දිස්ත්‍රික් ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ කාණ්ඩය/පත්ඉරුව සී 649/244හි ලියාපදිංචි කර ඇත.

2. දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, වැල්ලබඩ පත්තුවේ, මාදම්පේ විල්ලිගම පිහිටි පට්ටියවත්ත නමැති ඉඩමේ කැබලි අංක 3හි කැබලි අංක 3ඩී ලකුණු කළ බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම්, උතුරට : මෙම ඉඩමේ කැබැලි අංක 3හි 3ඒ කොටස ද, නැගෙනහිරට : මෙම ඉඩමේ කැබලි අංක 3හි 3සී කොටස ද, දකුණට : ගම්සභා පාර සහ බස්නාහිරට : මෙම ඉඩමේ කැබලි අංක 3හි 3බී කැබැල්ල යන මායිම් තුළ බලයලත් මිනින්දෝරු ටී. බී. ඒ ද සිල්වා විසින් සාදන ලද 1996.02.15 දිනැති අංක 5466 දරන සැලැස්මේ පෙන්නුම් කරන පර්චස් හයක් (අ. 0, රූ. 0, පර්. 6) විශාල බර පැටවූ හෝ නොපැටවූ කරත්ත, වැගන්, වෙනත් රිය සහ මෝටර් වාහන ඇතිව හෝ නැතිව යාමට උවමනාව, ආපසු ඒම, පසුකර යාම සහ නැවත පසුකර යාම සහ ගවයන් සහ වෙනත් සතුන් තුළ, හරහා හෝ දිගේ ගෙනයාම සමඟ ප්‍රවේශවීමේ, පිටවීමේ සහ ප්‍රතිගමනය කිරීමේ, හරහා යාමේ අයිතිය, හිමිකම හිමිකම් පෑම සහ කැනීම් කිරීමේ අයිතිය සමඟ, ඉඩම. මෙය ගාල්ල දිස්ත්‍රික් ඉඩම් ලියා පදිංචි කිරීමේ කාර්යාලයේ කාණ්ඩය/පත් ඉරුව සී 649/245හි ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සී. කොටිගල,
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී-නීති.

07-367/3

---

## සීමාසහිත සම්පත් බැංකුව

### 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ සීමාසහිත සම්පත් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මුතිය

ගිණුම් අංකය : 0033 5000 1483.

සීමාසහිත සම්පත් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2004.03.25 වැනි දින පවත්වන ලද රැස්වීමේදී විශේෂයෙන්ම සහ ඒකච්ඡන්දයෙන් පහත දැක්වෙන යෝජනාව සම්මත කර ගන්නා ලදී.

සීමාසහිත සම්පත් බැංකුව නමට කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් කේ. එස්. ජී. ඩබ්ලිව්. ජයවීර විසින් ලියා සහතික කරන ලද 1714 හා 2001 නොවැම්බර් මස 23 වැනි දින දරන උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුදල් ගෙවීම, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ රත්නපුර, මිහිඳුගම, අංක 38/1හි පදිංචි මොහමඩ් ජිෆ්රි මොහමඩ් සිනාන් විසින් එකී බැඳුම්කරයේ බන්ධනදායී වශයෙන් සිටිමින් පැහැර හැර ඇති හෙයින් ද, එකී බැඳුම්කරය මත 2003 දෙසැම්බර් මස 12 වැනි දිනට රුපියල් හාරලක්ෂ තිස්හතර දහස් අටසිය අනූහතරයි ශත පනස් අටක (රු. 4,34,894.58)ක මුදලක් ශ්‍රී ලංකාවේ වලංගු මුදලින් සීමාසහිත සම්පත් බැංකුවට ලැබිය යුතුව සහ අයවිය යුතුව ඇති හෙයින් ද, එකී රුපියල් හාරලක්ෂ තිස්හතර දහස් අටසිය අනූහතරයි ශත පනස් අට (රු. 4,34,894.58)ක මුදල සහ 2003 දෙසැම්බර් මස 13 වැනි දින සිට දේපළ විකිණීමේ දිනය දක්වා කාලයට රුපියල් තුන්ලක්ෂ හතලිස් හයදහසක් (රු. 3,46,000)ක් සඳහා වර්ෂයකට සියයට විසිතුන (23%) බැගින් වූ වැඩිදුර පොලිය සහ ප්‍රචාරක දැන්වීම් ගාස්තු සහ වෙනත් ගාස්තු ද යන මුදල් ප්‍රමාණ, ඉන් පසුව යම් මුදලක් ගෙවා ඇත්නම් ඒ මුදල අඩුකොට අය කර ගැනීම සඳහා ඉහත කී අංක 1714 දරන උකස් බැඳුම්කරය මගින් සීමාසහිත සම්පත් බැංකුව වෙත උකස් කර ඇත්තා වූ ද මෙහි උපලේඛනයේ සවිස්තර විස්තර කොට ඇත්තාවූ ද, දේපළ සහ පරිශ්‍රය, මහනුවර ප්‍රසිද්ධ වෙන්දේසිකාර අයි. ඩබ්ලිව්. ජයසූරිය මහතා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පැවරී ඇති බලතල ප්‍රකාර සීමාසහිත සම්පත් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් යෝජනා සම්මත කර ගනී.

#### උපලේඛනය

සබරගමුව පළාතේ, රත්නපුර දිස්ත්‍රික්කයේ, කුරුවිට කෝරළේ, දකුණු උඩ පත්තුවේ, ගොඩිගමුව නමැති ගමෙහි පිහිටි බලයලත් මිනින්දෝරු එච්. පී.

එස්. රාජපක්ෂ මහතා විසින් මැන සාදන ලද අංක 963 සහ 2001 ඔක්තෝබර් මස 09 වැනි දින දරන පිඹුරේ දැක්වෙන 'මහවලවත්තේ කොටසක්' නමැති ඉඩමේ බෙදා වෙන් කළ ලොට් ඒ දරන කට්ටිය වන උතුරට : එෆ්. වී. පී. 346 හි ලොට් 297 ද, නැගෙනහිරට : එෆ්. වී. පී. 346හි ලොට් 296 සහ 301 ද, දකුණට : එෆ්. වී. පී. 346 හි ලොට් 306 (පාරට යාබද රක්ෂිත බිම) සහ බස්නාහිරට : එෆ්. වී. පී. 346හි ලොට් 299 ද, මායිම් වන එකී අංක 963 දරන පිඹුර ප්‍රකාරව පර්චස් දහඅටයි දශම දෙකයි තුන (අ. 0, රූ. 0, පර්. 18.23) ක් විශාල ඉඩම වේ. මෙය රත්නපුර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එල්ඩීඕ 01/5819 වෙළුමේ/පත්‍රුරුවේ ලියාපදිංචි වී ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් ලේකම්.

07-381/1

---

## සීමාසහිත සෙලාන් බැංකුව - අවිස්සාවේල්ල ශාඛාව

### 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ සීමාසහිත සෙලාන් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද සම්මුතිය

ගිණුම් අංකය : 0750-00451520-001.

සීමාසහිත සෙලාන් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2006.04.07 වැනි දින පවත්වන්නට යෙදුනු රැස්වීමේදී 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වන වගන්තිය යටතේ විශේෂයෙන් සහ ඒකමතිකව පහත සඳහන් අයුරු සම්මත කර ගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

සීමාසහිත සෙලාන් බැංකුව නමට ලියන ලද ප්‍රසිද්ධ නොතාරිස් ඕ. එන්. ඊ. ද ජේ. සෙනෙවිරත්න විසින් සහතික කරන ලද 1999 ඔක්තෝබර් මස 01 දිනැති අංක 3819, 1999 ඔක්තෝබර් මස 08 දිනැති අංක 3831 සහ 2001 ජනවාරි මස 30 දිනැති අංක 3963 දරන බැඳුම්කරය මත අයවිය යුතු මුදල් ගෙවීම, දෙදෙනාම පුවක්පිටිය පදිංචි සෙනරත් මුදලිගේ දොන් බර්නාඩ් සුසිල් සහ පුස්සැල්ලගේ නදීකා මල්කාන්ති සිල්වා යන අය බන්ධනදායීන් වශයෙන් පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කර යටතේ රුපියල් පන්ලක්ෂ එකසිය පනස් අටයි ශත තිස් පහක (රු. 5,00,158.35) මුදලක්, 2005 අප්‍රේල් මස 30 වැනි දින වන විට සීමාසහිත සෙලාන් බැංකුවට ලැබිය යුතුව සහ අයවිය යුතුව ඇති හෙයින් ද එකී රු. 5,00,158.35 මුදල ද, 2005 මැයි මස 01 දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට, එම මුදලට වර්ෂය සියයට තිස්දෙක (32%) බැගින් වූ පොලිය සමඟ ප්‍රසිද්ධ කිරීමේ වියදම් සහ දරන්නට යෙදුනු වෙනත් ගාස්තු ද තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (ඇත්නම්) එම මුදල අඩුකර අයකර ගැනීම පිණිස ඉහත කී අංක 3819, 3831 සහ 3963 දරන බැඳුම්කර මගින් සීමාසහිත සෙලාන් බැංකුව වෙත උකස් කර ඇත්තාවූ මෙහි පහත සඳහන් උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇති දේපළ සහ පරිශ්‍රය බලයලත් වෙන්දේසිකාර තුසිත කරුණාරත්න මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත මගින් පැවරී ඇති බලතල අනුව සීමාසහිත සෙලාන් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, (අවිස්සාවේල්ල ලියාපදිංචි කිරීමේ දිස්ත්‍රික්කයේ) කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරළේ, උඩුගහ පත්තුවේ, අවිස්සාවේල්ල කුඩාගම පාර දිගේ පිහිටි බලයලත් මිනින්දෝරු ඒ. පී. එස්. ගුණවර්ධන විසින් සාදන ලද 1982.05.01 දිනැති අංක 1444 දරන සැලැස්මේ සඳහන් හොනිටන් එස්ටේට් නමැති ඉඩමේ ඕ2 කැබැල්ලෙහි අතුරු බෙදීමක් වන බලයලත් මිනින්දෝරු යූ. ආර්. එදිරිසිංහ විසින් සාදන ලද 1994.03.24 දිනැති අංක 867 දරන සැලැස්මේ සඳහන් කැබලි අංක 14 ලකුණු කළ බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම්, උතුරට : කුඩාගම සිට හොනිටන් පෙදෙසට යන මහා මාර්ගය ද, නැගෙනහිරට : අංක 867 දරන සැලැස්මේ සඳහන් 13, 12 සහ 11 දරන ඉඩම් කැබලි ද, දකුණට : එහි සඳහන් අංක 42 කැබැල්ල සහ බස්නාහිරට : අංක 15 දරන ඉඩම් කැබැල්ල යන මායිම් තුළ එකී අංක 867 දරන සැලැස්ම අනුව පර්චස් දහසයක් (අ. 0, රූ. 0, පර්. 16) විශාල ඉඩම. මෙය අවිස්සාවේල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ පී 34/262 යටතේ ලියාපදිංචි කර ඇත.

2. පෙර කී අවිස්සාවේල්ල කුඩාගම පාර දිගේ පිහිටි බලයලත් මිනින්දෝරු ඒ. පී. එස්. ගුණවර්ධන විසින් සාදන ලද 1982.05.01 දිනැති අංක 1444 දරන සැලැස්මේ පෙන්නුම් කරණු ලබන හොනිටන් එස්ටේට් නමැති ඉඩමේ ඕ2 කැබැල්ලෙහි අතුරු බෙදීමක් වන බලයලත් මිනින්දෝරු යූ. ආර්. එදිරිසිංහ විසින් සාදන ලද 1994.03.24 දිනැති අංක 867 දරන සැලැස්මේ සඳහන් කැබලි අංක 42 ලකුණු කළ බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම්, උතුරට : කැබැලි අංක 14 ද, නැගෙනහිරට : කැබැලි අංක 11 සහ 10 ද, දකුණට : කැබැලි අංක 43 සහ බස්නාහිරට : කැබැලි අංක 41 සහ 134 (පාර සඳහා වෙන් කිරීම) යන මායිම් තුළ එකී අංක 867 දරන සැලැස්ම අනුව පර්චස් දහයක් (අ. 0, රූ. 0, පර්. 10) විශාල ඉඩම. මෙය අවිස්සාවේල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ පී 34/288, 93/241 යටතේ ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සී. කොටිගල,
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී-නීති.

07-367/1

---

## සීමාසහිත සෙලාන් බැංකුව - රත්නපුර ශාඛාව

### 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ සීමාසහිත සෙලාන් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද සම්මුතිය

ගිණුම් අංකය : 0070-00050066 -001.

සීමාසහිත සෙලාන් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2006.06.21 වැනි දින පවත්වන්නට යෙදුනු රැස්වීමේදී 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වන වගන්තිය යටතේ විශේෂයෙන් සහ ඒකමතිකව පහත සඳහන් අයුරු සම්මත කර ගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

සීමාසහිත සෙලාන් බැංකුව නමට ලියන ලද ප්‍රසිද්ධ නොතාරිස් එස්. සී. ඕ. ද ලිවේරා විසින් සහතික කරන ලද 1990 අප්‍රේල් මස 24 දිනැති අංක 168 දරන බැඳුම්කරය මත අයවිය යුතු මුදල් ගෙවීම, රත්නපුරයෙහි සිල්වලැන්ඩ් කම්පනි යන නාමය, විලාශය සහ අභිධානය යටතේ ව්‍යාපාර ලියාපදිංචි අංක ඒ6956 යටතේ ව්‍යාපාර පවත්වාගෙන යන වූලනී සරත්

නාඹටුන්න යන අය බන්දනදායී වශයෙන් පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරය යටතේ රුපියල් විසිහතරලක්ෂ හැටහතර දහස් හාරසිය දහතුනයි ශත තිස්හතක් (රු. 24,64,413.37)ක මුදලක් 2005 දෙසැම්බර් මස 31 වැනි දින වන විට සීමාසහිත සෙලාන් බැංකුවට ලැබිය යුතුව සහ අයවිය යුතුව ඇති හෙයින් ද, එකී රු. 24,64,413.37ක මුදල ද, 2006 ජනවාරි මස 01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට, එම මුදලට වර්ෂයකට සියයට තිස් දෙක (32%) බැගින් වූ පොළිය සමහ ප්‍රසිද්ධ කිරීමේ වියදම් සහ දරන්නට යෙදුනු වෙනත් ගාස්තුද තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (ඇත්නම්) එම මුදල අයකර ගැනීම පිණිස ඉහත කී අංක 168 දරන බැඳුම්කරය මගින් සීමාසහිත සෙලාන් බැංකුව වෙත උකස් කර ඇත්තාවූ මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇති දේපළ බලයලත් වෙන්දේසිකාර අයි. ඩබ්ලිව්. ජයසූරිය මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත මගින් පැවරී ඇති බලතල අනුව සීමාසහිත සෙලාන් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරනු ලැබේ.

### උපලේඛනය

සබරගමුව පළාතේ, රත්නපුර කුරුවිටි කෝරළේ උඩපත්තු දකුණ රත්නපුර සහකාර ආණ්ඩුවේ ඒජන්තගේ කොට්ඨාසය තුළ රත්නපුර මහ නගර සභාවේ පොම්පකැලේ කොට්ඨාසයේ මල්වල පාර පිහිටි රත්නපුර දිසා අධිකරණයේ අංක 9796 දරන බෙදුම් නඩු වාර්තාවේ ගොනු කර ඇති බලයලත් මිනින්දෝරු බී. ඒ. තම්බයියා මහතා විසින් සාදන ලද 1958 නොවැම්බර් මස 06 දිනැති අංක 1751 දරන අවසාන බෙදා වෙන් කිරීමේ යෝජනා ක්‍රමයේ කැබලි අංක 3 සේ විස්තර කර පෙන්නුම් කරනු ලබන මල්වල පාර වරිපනම් අංක 21 දරන හේවායලාගේකනත්ත යනුවෙන් හඳුන්වනු ලබන බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම්, උතුරට : එකී සැලැස්මේ කැබලි අංක 21 සේ පෙන්නුම් කරනු ලබන පාර ද, නැගෙනහිරට : මහා මාර්ගය ද, දකුණට : එකී අංක 1751 දරන සැලැස්මේ සඳහන් කැබලි අංක 10 ද, බස්නාහිරට : එකී අංක 1751 දරන සැලැස්මේ කැබලි අංක 21 සේ පෙන්නුම් කරනු ලබන පාර ද යන මායිම් තුළ රූඩ් එකයි පර්චස් තිස්නවයක් (අ. 0, රූ. 1, පරු. 39) විශාල, ගොඩනැගිලි, වගා සහ එහි පිහිටි වෙනත් සියලු දේ සමහ ඉඩම, මෙය රත්නපුර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ කාණ්ඩය සහ පත්ඉරුව ඒ 590/143 යටතේ ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සී. කොටිගල,
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී-නීති.

07-367/2

---

## කොමර්පල් බැංක් ඔෆ් සිලෝන් ලිමිටඩ්

### 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ කොමර්ෂල් බැංක් ඔෆ් සිලෝන් ලිමිටඩ් හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

ගිණුම් අංකය : 181916. - ටවර් බිල්ඩර්ස්.

2005 ඔක්තෝබර් මස 26 වැනි දින පවත්වන ලද කොමර්ෂල් බැංක් ඔෆ් සිලෝන් ලිමිටඩ් හි අධ්‍යක්ෂ මණ්ඩලයේ රැස්වීමේ දී මතු දැක්වෙන යෝජනාව විශේෂයෙන්ම සහ ඒකච්ඡන්දයෙන් සම්මත කර ගන්නා ලදී :

ගාල්ල ප්‍රසිද්ධ නොතාරිස් අයි. එස්. විජේසේකර විසින් සහතික කරන ලද්දාවූද, කොමර්ෂල් බැංක් ඔෆ් සිලෝන් ලිමිටඩ් හි නමට ලියන ලද්දාවූද, 2003 දෙසැම්බර් මස 31 වැනි දින හා අංක 1298 සහ 2005 පෙබරවාරි මස 25 වැනි දින හා අංක 1712 දරන බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම කළුතොටගේ අමරවීර ණයකරු හැටියට ද පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරය යටතේ රුපියල් පනස් හය ලක්ෂ හැත්තෑතුන් දහස් හත්සිය නවයයි ශත පනස් අටක (රු. 56,73,709.58)ක මුදලක් 2005 ඔක්තෝබර් මස 04 වැනි දින වන විට කොමර්ෂල් බැංක් ඔෆ් සිලෝන් ලිමිටඩ් ට අයවිය යුතුව ඇති හෙයින් එකී රුපියල් පනස්හය ලක්ෂ හැත්තෑතුන් දහස් හත්සිය නවයයි ශත පනස් අටක (රු. 56,73,709.58) මුදලට 2005 ඔක්තෝබර් මස 05 වැනි දින සිට දේපළ විකිණීමේ දිනය දක්වා කාලයට රුපියල් 44,00,000ක මුදල මත 20% ක වැඩිදුර වාර්ෂික පොළියද, ප්‍රචාරක වියදම් සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු සහ මුදල් ප්‍රමාණයන්ද, තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේනම් ඒ මුදලත් අඩුකොට එකී අංක 1298 සහ 1712 දරන උකස් බැඳුම්කරය මගින් කොමර්ෂල් බැංක් ඔෆ් සිලෝන් ලිමිටඩ් වෙත උකස් කොට ඇත්තාවූද, මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇත්තාවූද දේපළ සහ පරිශ්‍රය කොළඹ 12, හල්ස්ඩෝප් වීදියේ අංක 99 හි බලයලත් වෙන්දේසිකරු එල්. බී. සේනානායක මහතා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ කොමර්ෂල් බැංක් ඔෆ් සිලෝන් ලිමිටඩ් හි අධ්‍යක්ෂ මණ්ඩලය මේ මගින් යෝජනා සම්මත කර ගනී.

### උපලේඛනය

දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, තල්පෙ පත්තුව තලාහේ පිහිටි (ගාල්ල දිසා අධිකරණයේ බෙදුම් නඩු අංක පී/6091 දරන නඩුවේ වාර්තාගත වූ බලයලත් මානක ඩී. වීරසේකර විසින් 1985 ඔක්තෝබර් මස 14 වැනි දින සහ නොවැම්බර් මස 7, 18 සහ 20 වන දිනයන් හි සාදන ලද අංක 2161 දරන පිඹුරේ පෙන්වා ඇති) දෙල්ගහවත්ත *හෙවත්* කනත්තවත්ත ඉඩමේ ලොට් අංක 1 සහ (බලයලත් මානක ඒ. වීරසිංහ විසින් 1995 අගෝස්තු මස 20 වැනි දින සාදන ලද අංක 344 දරන පිඹුරේ පෙන්වා ඇති) පරගහවත්ත *හෙවත්* ගොඩපරගහවත්ත ඉඩමේ වෙන් කරන ලද ලොට් "ඒ" දරන ඒකාබද්ධ ඉඩම් දෙකෙහි පිහිටි ගොඩනැගිලි වගාවන් සහ සියලුදේත් සමග බෙදන ලද ලොට් "බී" දරන ඉඩම් කොටසට මායිම්, උතුරට : පත්තිනිගෙවත්ත *හෙවත්* පරගහවත්ත *හෙවත්* බටදොඹගහවත්ත සහ පරගහවත්ත *හෙවත්* ගොඩපරගහවත්ත ඉඩමේ ලොට් 28 සහ 29 ද, නැගෙනහිරට : ලොට් අංක 15, 24 (අඩි 4 ක් පළල පාර) සහ දෙල්ගහවත්ත *හෙවත්* කනත්තෙවත්ත ඉඩමේ ලොට් 2 සහ පරගහවත්ත *හෙවත්* ගොඩපරගහවත්ත ඉඩමේ ලොට් 23 ද, දකුණට : ලොට් 15, 24 (අඩි 04 ක් පළල පාර) සහ දෙල්ගහවත්ත *හෙවත්* කනත්තවත්ත ඉඩමේ ලොට් 2 සහ පරගහවත්ත හෙවත් ගොඩපරගහවත්ත ඉඩමේ ලොට් 23 සහ 17 ද සහ බටහිරට : පරගහවත්ත *හෙවත්* ගොඩපරගහවත්ත ඉඩමේ ලොට් 54 (පාරද) සහ පරගහවත්ත *හෙවත්* ගොඩපරගහවත්ත ඉඩමේ ලොට් 28 සහ 29 ද යන මායිම් තුළ රූඩ් එකයි පර්චස් තිස්හතයි දශම හයක් (අ. 0, රූ. 1, පර්. 37.6) හෝ හෙක්ටයාර් 0.1963 බලයලත් මානක ඒ. වීරසිංහ විසින් 2001 සැප්තැම්බර් මස 07 වැනි දින සාදන ලද අංක 827 දරන පිඹුර පරිදි ගාල්ල දිස්ත්‍රික් ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඩී 841/265 යටතේ ලියාපදිංචිව ඇත.

ආර්. ආර්. දුනුවිල මහත්මිය,
සමාගම් ලේකම්.

07-342

## සීමාසහිත සම්පත් බැංකුව

### 1990 අංක 04 දරන බැංකු මගින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වන වගන්තිය යටතේ සීමාසහිත සම්පත් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

ගිණුම් අංක : 0035 1000 1507.

2005.01.20 වන දින සීමාසහිත සම්පත් බැංකුවේ අධක්ෂ මණ්ඩලය විසින් පවත්වන්නට යෙදුණු රැස්වීමකදී මෙසේ විශේෂිතව හා ඒකමතිකව යෝජනා කොට සම්මත කර ගන්නා ලදී.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ බලපිටිය, ගාලුපාරේ, අංක 183 දරන ස්ථානයේ ටානියා එන්ටර්ප්‍රයිසස් යන ව්‍යාවහාරික ව්‍යාපාර නාමය යටතේ එකම අයිතිකරු වශයෙන් ව්‍යාපාරික කටයුතු කරගෙන යන ලද්දුසිංහ බදුගේ සෙනරත් යන අය බන්ධනදායී වශයෙන් මාතර ප්‍රසිද්ධ නොතාරිස් එස්. ඩී. හේවාවිතාරණ විසින් සීමාසහිත සම්පත් බැංකුව නමට ලියා සහතික කළ 2001 මැයි 25 දාතම හා අංක 110 දරන උකස් බැඳුම්කරය මත සීමාසහිත සම්පත් බැංකුවට අයවිය යුතු මුදල් ගෙවීම පැහැර හැරීමේ හේතුවෙන් 2004 ඔක්තෝබර් 31 වැනි දිනට සීමාසහිත සම්පත් බැංකුවට ශ්‍රී ලංකාවේ වලංගු මුදලින් රුපියල් අටලක්ෂ තිස්තුන් දහස් පන්සිය හතලිහයි ශත දහයක (රු. 8,33,540.10)ක මුදල් ප්‍රමාණයක් අයවිය යුතුව ඇති හෙයින් එකී රුපියල් අටලක්ෂ තිස්තුන් දහස් පන්සිය හතලිහයි ශත දහයක (රු. 8,33,540.10) සම්පූර්ණ මුදල සමග තවත් රුපියල් දෙලක්ෂයක (2,00,000) මුදල සඳහා වසරකට සියයට දාහත් (17%) බැගින් ද, තවත් රුපියල් දෙලක්ෂ පනස් එක් දහස් හත්සිය පනස් හතයි ශත හතලිස් එකක (රු. 2,51,757.41) මුදල සඳහා වසරකට සියයට දහඅට දාහතර (14%) බැගින් තවත් රුපියල් දෙලක්ෂ හැත්තෑ දහසක (රු. 2,70,000) මුදල සඳහා වසරකට (18%) බැගින්ද තවත් රුපියල් අසූනව දහස් නවසිය පනහක (89, 950) මුදල සඳහා වසරකට සියයට පහළොව (15%) බැගින්ද, 2004 නොවැම්බර් 1 වන දින සිට වෙන්දේසි දින දක්වා තවදුරටත් පොළී මුදල්ද සමග ප්‍රචාරක වියදම් සහ වෙනත් අයකිරීම් වෙතොත් ඒවාද සමග අයකර ගැනීම සඳහා එකී අංක 110 දරන බැඳුම්කරය මගින් සීමාසහිත සම්පත් බැංකුවට උකස් තබන ලද, මෙහි පහත උපලේඛනයේ වඩාත් මැනැවින් විස්තර කොට ඇති දේපළ සහ පරිශ්‍රය මහනුවර බලයලත් වෙන්දේසිකරු අයි. ඩබ්ලිව්. ජයසූරිය විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණාලිය යුතු බවට, සීමාසහිත සම්පත් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 1990 අංක 04 දරන බැංකු මගින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් තමන් වෙත පැවරී ඇති බලය පරිදි මෙසේ යෝජනා කොට සම්මත කරගන්නා ලදී.

#### උපලේඛනය

දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, බෙන්තොට වලල්ලාවිට කෝරළේ, බලපිටියේ ගල්මන්ගොඩ පිහිටි අම්බලම්වත්ත ලොට් 1 සහ 2 ප්‍රත්‍යාසන්න ඉඩමේ ලොට් E වශයෙන් ලකුණු කොට දක්වා ඇති අම්බලන්ගොඩ බලයලත් මිනින්දෝරු ඩී. ජී. මෙන්දිස් විසින් සාදන ලද 1985 අගෝස්තු 3 දාතම හා අංක 1755 දරන බලපිටිය ඉඩම් කාර්යාලයේ වෙළුම/පත්ඉරුව B 321/190 හි ලියාපදිංචි කොට ඇති පිඹුරේ නිරූපිත පරිදි උතුරට : අම්බලම්වත්ත ලොට් 1 හා 2 ප්‍රත්‍යාසන්න ඉඩමේ ලොට් D ද, ගිණිකොණට : මාදු ගඟද සහ බටහිරට : ගාලු පාරද මායිම් වන ප්‍රමාණයෙන් රූඩ් දෙකයි පර්චස් දාහතයි දශම දෙකයි පහක් (අ. 0, රූඩ් 2, පර්. 17.25) වන බෙදා වෙන්කොට සීමා නිර්නය කළ ත්‍රිකෝණාකාර සම්පූර්ණ ඉඩම එහි පිහිටි වගාවන් සහ වෙනත් සියළුම දේ සමගය.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගමේ ලේකම්.

07-381/9

## සීමාසහිත සම්පත් බැංකුව

### 1990 අංක 04 දරන බැංකු මගින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වන වගන්තිය යටතේ සීමාසහිත සම්පත් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

ගිණුම් අංක : 0005 5004 0964.

2004.10.14 වන දින පවත්වන්නට යෙදුණු රැස්වීමකදී සීමාසහිත සම්පත් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් විශේෂිතව හා ඒකමතිකව මෙසේ සම්මත කර ගන්නා ලදී.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මාකොල, මාකොල උතුර දේවාල පාරේ 5/7 හි මාකවිටගේ චමින්ද තුෂාර පෙරේරා යන අය 'බන්දනදායී' වශයෙන් මාකොල, මාකොල උතුර අංක 06හි එකි මාකවිටගේ චමින්ද තුෂාර පෙරේරා සහ ආතාවුද ආරච්චිගේ එතල් බ්‍රියට්‍රිස් අමරසේකර යන අය 'උකස්කරුවන්' වශයෙන් ද කොළඹ බලයලත් ප්‍රසිද්ධ නොතාරිස් ඩබ්ලිව්. පී. කේ. විජේතුංග විසින් සීමාසහිත සම්පත් බැංකුව නමට ලියා සහතික කළ 2001 ජූනි 26 දාතම හා අංක 309 දරන උකස් බැඳුම්කරය මත බැංකුවට අයවිය යුතු මුදල් ගෙවීම පැහැර හැරීමේ හේතුවෙන් 2004 සැප්තැම්බර් 01 වැනි දිනට රුපියල් අටලක්ෂ හැටහත්දහසක (රු. 8,67,000) මුදලක් සීමාසහිත සම්පත් බැංකුවට අයවිය යුතුව ඇති හෙයින් එකී රුපියල් අටලක්ෂ හැටහත් දහසක (8,67,000) මුදල සඳහා 2004 සැප්තැම්බර් 02 වැනි දින සිට වෙන්දේසි දින තෙක් තවදුරටත් පොළිය සමග සහ ප්‍රචාරක වියදම් හා වෙනත් අයකිරීම් වෙතොත් ඒවා ද සමග එතෙක් ගෙවා ඇති යම් මුදලක් (වේ නම්) අඩුකොට අයකර ගැනීම සඳහා එකී අංක 309 දරන බැඳුම්කරය මගින් සීමාසහිත සම්පත් බැංකුවට උකස් තබන ලද, මෙහි පහත උපලේඛනයේ වඩාත් මැනැවින් විස්තර කොට ඇති දේපළ සහ පරිශ්‍රය මහනුවර බලයලත් වෙන්දේසිකරු අයි. ඩබ්ලිව්. ජයසූරිය විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණාලිය යුතු බවට, සීමාසහිත සම්පත් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 1990 අංක 04 දරන බැංකු මගින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් තමන් වෙත පැවරී ඇති බලය පරිදි මෙසේ යෝජනා කොට සම්මත කරගන්නා ලදී.

#### උපලේඛනය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, සියනෑකෝරළයේ, අදිකාරිපත්තුවේ, බියගම ප්‍රාදේශීය සභා (මා කොළ උප කාර්යාලය) සීමාව තුළ උතුරු මාකොළ ග්‍රාමයේ පිහිටි මාකොල උතුර වරිපනම් අංක 05/07 දරන (වඩාත් නිවැරදිව තැබිලිගස්මුල්ල පාරේ වරිපනම් අංක 14 දරණ) "මීගහවත්ත" නමැති ඉඩමෙන් බලයලත් මිනින්දෝරු එස්. සමරවික්‍රම විසින් මැන සාදන ලද 1989 මැයි 25 දාතම හා අංක 138/1989 දරන පිඹුරේ නිරූපිත ලොට් Y වශයෙන් ලකුණු කොට ඇති ඊසාන දිගට : ලොට් X ද, ගිනිකොණට : අංක 4217 දරන පිඹුරේ ලොට් 05 ද, නිරිතට : අංක 4217 ලොට් 07 ද සහ වයඹට: තැබිලිගස්මුල්ල පාර සහ දේවාල පාරද මායිම් වන ගම්පහ ඉඩම් කාර්යාලයේ සී 585/72 වෙළුම/පත්ඉරුව හි ලියාපදිංචි කොට ඇති එකී අංක 138/1989 දරන පිඹුරට අනුව ප්‍රමාණයෙන් පර්චස් හතයි දශම එකයි බිංදුවක් (අ. 0, රූ. 0, පර්. 7.10) වන බෙදා වෙන් කොට සීමා නිර්නය කළ බිම් කොටස එහි පිහිටි පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ සෑම සියළු දේ සමගය.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගමේ ලේකම්.

07-381/8

## සීමාසහිත සම්පත් බැංකුව

### 1990 අංක 04 දරන බැංකු මගින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වන වගන්තිය යටතේ සීමාසහිත සම්පත් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

ගිණුම් අංකය : 0018 5000 3110.

2005 ඔක්තෝබර් 27 වන දින පවත්වන්නට යෙදුණු රැස්වීමකදී සීමාසහිත සම්පත් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් විශේෂිතව හා ඒකමතිකව මෙසේ සම්මත කර ගන්නා ලදී.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ රත්මලාන, රීටා පාරේ, අංක 46 හි පදිංචි දෝන රත්සිරිනි වින්සෙන්ෂියා සිල්වා විවාහයට පෙර බියන්විල සහ බන්දුල සිල්වා යන දෙදෙන බන්ධනදායින් වශයෙන්ද, ඉහත කී රත්මලාන, රීටා පාරේ අංක 46 හි දෝන රත්සිරිනි වින්සෙන්ෂියා සිල්වා විවාහයට පෙර බියන්විල යන අය උකස්කරු වශයෙන්ද කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් කේ. එස්. පී. ඩබ්ලිව්. ජයවීර විසින් සීමාසහිත සම්පත් බැංකුව නමට ලියා සහතික කළ 1999 නොවැම්බර් 17 දාතම හා අංක 928 දරන උකස් බැඳුම්කරය මත බැංකුවට අයවිය යුතු මුදල් ගෙවීම පැහැර හැරීමේ හේතුවෙන් 2003 සැප්තැම්බර් 29 වන දිනට රුපියල් දාහතර ලක්ෂ විසිතුන්දහස් පන්සිය තිහයි ශත අනූ හතරක (රු. 14,23,530.94) මුදලක් ශ්‍රී ලංකාවේ වලංගු මුදලින් සීමාසහිත සම්පත් බැංකුවට අයවිය යුතුව ඇති හෙයින් එකී රුපියල් දාහතර ලක්ෂ විසිතුන්දහස් පන්සිය තිහය ශත අනූ හතරක (රු. 1,423,530.94) සම්පූර්ණ හිඟ මුදල සමග රුපියල් තුන්ලක්ෂ අනූපන්දහස් නවසිය අටයි ශත අනූහතරක (3,95,908.94) මුදල සඳහා වසරකට සියයට විස්ස (20%) බැගින්ද, තවත් රුපියල් දෙලක්ෂ පනස් දහසක (රු. 2,50,000) මුදල සඳහා වසරකට සියයට විසිඑක (21%) බැගින්ද, 2003 සැප්තැම්බර් 30 වැනි දින සිට වෙන්දේසි දින තෙක් තවදුරටත් පොළී මුදලද සමග ප්‍රචාරක වියදම් හා වෙනත් අයකිරීම් වෙතොත් ඒවාද සමග එතෙක් ගෙවා ඇති යම් මුදලක් (වේ නම්) අඩුකොට අයකර ගැනීම සඳහා එකී අංක 928 දරන බැඳුම්කරය මගින් සීමාසහිත සම්පත් බැංකුවට උකස් තබන ලද, මෙහි පහත උපලේඛනයේ වඩාත් මැනැවින් විස්තර කොට ඇති දේපළ සහ පරිශ්‍රය මහනුවර බලයලත් වෙන්දේසිකරු අයි. ඩබ්ලිව්. ජයසූරිය විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණාලිය යුතු බවට, සීමාසහිත සම්පත් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 1990 අංක 04 දරන බැංකු මගින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් තමන් වෙත පැවරී ඇති බලය පරිදි මෙසේ යෝජනා කොට සම්මත කරගන්නා ලදී.

#### උපලේඛනය

වයඹ පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරලේ පල්ලේපත්තුවේ, හෝමාගම ප්‍රාදේශීය සභා සීමාව තුළ තලවතුගොඩ පිහිටි අඹගහවත්ත *නොහොත්* තල්ගහවත්ත නමැති ඉඩමෙන් බලයලත් මිනින්දෝරු ජී. පී. අබේනායක විසින් මැන සාදන ලද 1988 පෙබරවාරි 15 දාතම හා අංක 902 දරන පිඹුරේ නිරූපිත ලොට් 4 වශයෙන් ලකුණු කොට දක්වා ඇති හෝමාගම ඉඩම් කාර්යාලයේ G 1022/250 හි ලියාපදිංචි කොට ඇති එකී අංක 902 පිඹුරට අනුව උතුරට : ලොට් 3 ද, නැගෙනහිරට : ලොට් 6 (අඩි 15 පාරට වෙන්කළ කොටස) ද, දකුණට : ලොට් 5 ද, බටහිරට : ලොට් 7 (අගල) ද මායිම් වන ප්‍රමාණයෙන් පර්චස් දහතුනයි දශම දෙකයි තුනක් (අ. 0, රූ. 0, පර්. 13.23)ක් වන බෙදා වෙන් කොට සීමා නිර්නය කළ ඉඩම් කොටස.

පහත දැක්වෙන මාර්ග රක්ෂිතය මතින් අතරින් හා ඔස්සේ මාර්ග අයිතිය හා වෙනත් අයිතීන්ද සමාන අයිතීන් ඇති අන් අය හා සමග පොදුවේ භුක්ති විඳීමේ අයිතිය ද සමගය.

ඉහත කී තලවතුගොඩ පිහිටි අඹගහවත්ත *නොහොත්* තල්ගහවත්ත නමැති ඉඩමේ ඉහත කී අංක 902 පිඹුරේ ලොට් 6 (අඩි 15 පළල පාර සඳහා වෙන්කළ කොටස) වශයෙන් ලකුණු කොට නිරූපිත, හෝමාගම ඉඩම් කාර්යාලයේ G 703/270 මැය යටතේ ලියාපදිංචි කොට ඇති එකී අංක 902 පිඹුරට අනුව උතුරට : අඩි 15 පාරට වෙන්කළ කොටස ද, නැගෙනහිරට : ඩබ්ලිව්. ඊ. එම්. ප්‍රේමදාස, එච්. ජේන් පෙරේරා, එම්. සිසිලියානා, එම්. කරුනාසේන සහ එම්. අමරාවතී පෙරේරා යන අය අයිතිය කියන ඉඩම්ද, දකුණට : ලොට් 5 ද සහ බටහිරට : ලොට් 5, 4, 3, 2 සහ 1 ද මායිම් වන ප්‍රමාණයෙන් පර්චස් දහසයයි දශම එකයි හයක් (අ. 0, රූඩ් 0, පර්. 16.16) වන බෙදා වෙන් කොට සීමා නිර්නය කළ සම්පූර්ණ ඉඩම් කොටස සහ එකී අංක 902 පිඹුරේ නිරූපිත එකී ලොට් 6 සිට ගුරු පාර දක්වා දිවෙන අඩි 15 පළල පාර.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගමේ ලේකම්.

07-381/5

---

## සීමාසහිත සම්පත් බැංකුව

### 1990 අංක 04 දරන බැංකු මගින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වන වගන්තිය යටතේ සීමාසහිත සම්පත් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

ගිණුම් අංක : 0033 5001 3082.

2005 සැප්තැම්බර් 01 වන දින සීමාසහිත සම්පත් බැංකුවේ අධක්ෂ මණ්ඩලය විසින් පවත්වන්නට යෙදුණු රැස්වීමකදී මෙසේ විශේෂිතව හා ඒකමතිකව යෝජනා කොට සම්මත කර ගන්නා ලදී.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ රත්නපුර, බටුගෙදර, පරණ පාරේ අංක 2/28 හි පදිංචි හත්නාගලගේ ප්‍රේමරත්න යන අය බන්ධනදායී වශයෙන් කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් කේ. එස්. පී. ඩබ්ලිව්. ජයවීර විසින් සීමාසහිත සම්පත් බැංකුව නමට ලියා සහතික කළ 2002 අගෝස්තු 29 දාතම හා අංක 1969 දරන උකස් බැඳුම්කරය මත සීමාසහිත සම්පත් බැංකුවට අයවිය යුතු මුදල් ගෙවීම පැහැර හැරීමේ හේතුවෙන් 2005 මැයි මස 10 වැනි දිනට ශ්‍රී ලංකාවේ වලංගු මුදලින් රුපියල් හත්ලක්ෂ හතලිස් දෙදහස් නවසිය විසිදෙකයි ශත තිස්හතක (රු. 7,42,922.37)මුදලක් එකී බැඳුම්කරය මත සීමාසහිත සම්පත් බැංකුවට අයවිය යුතුව ඇති හෙයින් එකී රුපියල් හත්ලක්ෂ හතලිස් දෙදහස් නවසිය විසි දෙකයි ශත තිස් හතක (රු. 7,42,922.37) ක සම්පූර්ණ හිඟ මුදල සමග තවත් රුපියල් පන්ලක්ෂයක (රු. 5,00,000) මුදල සඳහා වසරකට සියයට විසි එක (21%) බැගින් 2005 මැයි 11 වැනි දින සිට වෙන්දේසි දින තෙක් තවදුරටත් පොළී මුදලද සමග ප්‍රචාරක වියදම් සහ වෙනත් අයකිරීම් වෙතොත් ඒවාද සමග එතෙක් ගෙවා ඇති යම් මුදලක් (වේනම්) අඩුකොට අයකර ගැනීම සඳහා එකී අංක 1969 දරන බැඳුම්කර මගින් සීමාසහිත සම්පත් බැංකුවට උකස් තබන ලද මෙහි පහත උපලේඛනයේ වඩාත් මැනැවින් විස්තර කොට ඇති දේපළ සහ පරිශ්‍රය මහනුවර බලයලත් වෙන්දේසිකරු අයි. ඩබ්ලිව්. ජයසූරිය විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණාලිය යුතු බවට, සීමාසහිත සම්පත් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 1990 අංක 04 දරන බැංකු මගින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් තමන් වෙත පැවරී ඇති බලය පරිදි මෙසේ යෝජනා කොට සම්මත කරගන්නා ලදී.

#### උපලේඛනය

සබරගමුව පළාතේ, රත්නපුර දිස්ත්‍රික්කයේ, කුරුවිට කෝරලේ උතුරු උඩුපත්තුවේ මිල්ලවිටිය ග්‍රාමයේ පිහිටි මිල්ලවිටිය වත්ත සහ පෙලෙදෙණිය වත්ත නමින් හැඳින්වෙන ඉඩමෙන් බලයලත් මිනින්දෝරු එම්. වර්ණසූරිය

විසින් සාදන ලද 2000 නොවැම්බර් 25 දාතම හා අංක 347 දරන පිඹුරේ නිරූපිත ලොට් 1 C වශයෙන් ලකුණු කොට දක්වා ඇති රත්නපුර ඉඩම් කාර්යාලයේ A 735/20 හි ලියාපදිංචි කොට ඇති උතුරට : ලේල්ලගොඩ පාර සහ එකී පිඹුරේ ලොට් 1 B ද, නැගෙනහිරට : ලේල්ලගොඩ පාරද, දකුණට : හෙට්ටිණිය කුඹුර ඔස්සේ රක්ෂිතයද සහ බටහිරට : රක්ෂිතය හා හීන් කම්මලේ වත්ත ද මායිම් වන ප්‍රමාණයෙන් (අ. 3, රූඩ් 1, පර්. 19)ක් වන බෙදා වෙන්කොට සීමා නිර්නය කළ සම්පූර්ණ ඉඩම එහි පිහිටි පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ අනෙකුත් සියලු දේ සමඟ ය.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගමේ ලේකම්.

07-381/7

---

## රුහුණ සංවර්ධන බැංකුව-පිටබැද්දර ශාඛාව

### 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ රුහුණ සංවර්ධන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගැණුනු යෝජනාව

1997 අංක 06 දරන ප්‍රාදේශීය සංවර්ධන බැංකු පනත යටතේ ශ්‍රී ලංකා මහ බැංකුවේ මුල්‍ය මණ්ඩලය විසින් නිකුත් කරන ලද 1998.04.24 දින දරන අති *විශේෂ ගැසට්* නිවේදනයට අනුව පිහිටුවනු ලැබූ රුහුණ සංවර්ධන බැංකුව වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, 2006.04.25 දින පවත්වන ලද රුහුණ සංවර්ධන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරන ලදී.

රුහුණ සංවර්ධන බැංකුව නමට නීතිඥ සහ ප්‍රසිද්ධ නොතාරිස් මොහාන් එල්. ජී. ගමාච්චිගේ මහතා විසින් සහතික කරන ලද 1999.08.25 දිනැති අංක 2251 උකස්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම මොරවක, වැලිව, පිටවලලන්දහි පදිංචි සුනන්ද පේමවංශ විදානපතිරණ යන අය විසින් පැහැර හැර ඇති බැවින්ද, එකී උකස්කරය යටතේ රුපියල් එක්ලක්ෂ දහනමදහස් තුන්සියයක (1,19,300) මුදලක් රුහුණ සංවර්ධන බැංකුව වෙත ගෙවීමට ඇති බැවින්ද, 2002.01.02 දින සිට වර්ෂයකට 24% බැගින් රුපියල් එක්ලක්ෂ දහනමදහස් තුන්සියයක (රු. 1,19,300) ක මුදලක් සඳහා වෙන්දේසි දිනය තෙක් තවදුරටත් පොලිය හා වෙන්දේසි වියදම් ද සමග අනතුරුව කිසියම් මුදලක් ලැබීමට ඇත්නම් ඒවා අඩුව එකී මුදල අයකර ගැනීම සඳහා මාතර බලයලත් වෙන්දේසිකාර ජී. පී. ආනන්ද මහතා විසින් එකී අංක 2251 දරන උකස්කරය යටතේ බැංකුවට උකස්කර ඇති දේපළ සහ පරිශ්‍රයන් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතුයයි එකී බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් තීරණය කරනු ලැබේ.

### දේපළ පිළිබඳ විස්තර

දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, මොරවක් කෝරළයේ, වැලිවේ පිහිටි පිටවලගෙවත්ත හෙවත් පිටවලලන්දෙවත්ත නම්වූ ඉඩමේ බෙදා වෙන්කළ අංක 05 දරන කැබැල්ල නම්වූ, උතුරට : මෙම ඉඩමේ බෙදා වෙන්කළ අංක 04 දරන කැබැල්ලද, නැගෙනහිරට : මෙම ඉඩමේ බෙදා වෙන්කළ අංක 06 දරන කැබැල්ල ද, නිරිතට : විලකොලදෙනිය වෙන්කරන ගම් සභා පාරද, බස්නාහිරට : මෙම ඉඩමේ බෙදා වෙන්කළ අංක 04 දරන කැබැල්ලද මායිම් වූ පර්චස් හයයි දශම දෙකයි පහක් (අ. 0, රූ. 0, පර්. 6.25) විශාල ඉඩමේ පිහිටි 13 ×15 රියන් ගෙය සමග ඒ තුළ පිහිටි සියළු ගහකොළ, පළතුරු ආදිය සමගවේ. (ජී.82/139.)

මෙම දේපළ 82/139 යටතේ 1999.08.27 දින මොරවක ඉඩම් රෙජිස්ටාර් කාර්යාලයේ ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ටී. ජී. විමලරත්න,
සාමාන්‍යාධිකාරී.

2006 අප්‍රේල් මස 25 වැනි දින,
රුහුණ සංවර්ධන බැංකුව,
ප්‍රධාන කාර්යාලය, පඹුරන,
මාතර.

07-336

---

## මහජන බැංකුව

### 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 ඩී වගන්තිය යටතේ විකුණුම් දැන්වීම

2003.04.30 වැනි දින පැවැත්වූ මහජන බැංකු අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී 1986 අංක 32 දරන පනත මගින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 ඩී වගන්තිය අනුව පහත සඳහන් තීරණය ඒකමතිකව ගන්නා ලද බව මෙයින් දැනුම් දෙමු.

මහජන බැංකුව වෙනුවෙන් මඩකලපු දිස්ත්‍රික්ක නීතිඥ හා ප්‍රසිද්ධ නොතාරිස් වන ඩී. සී. වින්සෙයා මහතා 2000.08.30 දින සහතික කළ අංක 4874 දරන උකස්කරය මත වූ මුදල් ප්‍රමාණය ගෙවීමට වෙල්ලකුට්ටි මුහම්මදු ඉස්මායිල් හා බිරිඳ වෙල්ලතම්බි රහුමත්තුම්මා වැරැද්දූ නිසාත් සඳහන් කළ උකස්කරය මගින් දැනට මහජන බැංකුවට ගෙවිය යුතු මුදල නම් රුපියල් තුන්ලක්ෂ පනස් තුන් දහස් එකසීය (රු. 3,53,100) වන නිසාත්, මහජන බැංකු අධ්‍යක්ෂ මණ්ඩලය 1986 අංක 32 දරන පනත මගින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 ඩී වගන්තිය යටතේ තමන්ට පවරන ලද බලය උපයෝගී කොට සඳහන් කළ අංක 4874 දරන උකස්කරය මගින් බැංකුවට උකස් කළ දේපළ හා ඉඩම්, බලයලත් වෙන්දේසිකරු වන අලෙක්සාන්ඩර් එම්මානුවෙල් කිංස්ටන් දිසවීරසිංහ, අංක 8, මුදලියාර් පාර, මඩකලපුව මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණලා, එය මගින් සඳහන් කළ මුදල් ප්‍රමාණය වන රුපියල් තුන්ලක්ෂ පනස් තුන්දහස් එකසීය (3,53,100) ද, එය සමගම 2002.04.10 වැනි දින සිට විකුණන දිනය දක්වා එම රුපියල් තුන්ලක්ෂ පනස් තුන්දහස් එකසීය (3,53,100) මුදල් ප්‍රමාණය මත අවුරුද්දකට 26½%ක් පොලියද අය කළ යුතු වෙන්දේසි වියදම් හා වෙනත් ගාස්තුද මීට අතරතුර කිසියම් මුදලක් ගෙවා ඇත්නම් එවැනි මුදල් අඩුකර අයකර ගැනීමට මෙයින් තීරණය කරනු ලැබේ.

### දේපළ පිළිබඳ විස්තර

නැගෙනහිර පළාත, මඩකලපු දිස්ත්‍රික්ක, එරාවූර්පත්තු කොට්ඨාසයේ, එරාවූර්හි "මුනායා වලවු" හා "පල්මානික්කයඩි වලවු" ඒකාබද්ධවූ බෙදා මායිම් වෙන්කරනු ලැබූ ඉඩම් කැල්ලක් ගොඩනැගිලි, ගස්, වතු, පොළොව හා එහි හටගන්නා සියලු දේ අඩංගුව මායිම් විස්තර, උතුරට : එම්. සින්නලෙබ්බේගේ ඉඩම, නැගෙනහිරට හා දකුණට : එම්. වෙල්ලතම්බිගේ ඉඩමත් පටුමග ඉස්සරහ පැත්තත්, බටහිරට : කදිසාඋම්මාගේ ඉඩම. බිම් ප්‍රමාණය : උතුර සිට දකුණට බඹ 11 යි, නැගෙනහිර සිට බටහිරට බඹ 8 යි මෙම ඉඩම මඩකලපු ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වොලියුම්/ෆෝලියෝ අංක A76/177 යටතේ පාර අයිතිය සහිතව ලියාපදිංචි කර ඇත.

ඉහත සඳහන් ඉඩම ගැන බලයලත් මිනින්දෝරු සහ මට්ටම්කරු වන ඒ. සිංගරාජා මහතා විසින් 1999.07.26 දින සාදන ලද අංක AS/99/1272 දරන පිඹුරේ පහත සඳහන් පරිදි විස්තර කර ඇත.

ඉහත කියන ලද ඒරාවූර් නගර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ඒරාවූර් නගර ප්‍රාදේශීය සභා මායිම් වලට ඇතුළුව වාට්ටුව 2 කොට්ඨාසය 3 ඒරාවූර්හි පිහිටි බිම් කොටසක්, මායිම් විස්තර නම්, උතුරට : එස්. එල්. සෙයිලතුම්මාගේ ඉඩම, නැගෙනහිර හා දකුණට : වෙල්ලතම්බිගේ ඉඩමත්, මගත්, බටහිරට : එම්. සෙයිනම්බුගේ ඉඩම. බිම් ප්‍රමාණය ඉහත සඳහන් AS/99/1272 පිඹුර අනුව පර්චස් දහයයි දශම නමයයි පහයි (අ. 0, රූ. 0, පර්. 10.95).

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

එම්. බී. මනෝහරා,
සහකාර සාමාන්‍ය කළමනාකරු (නැක).

මහජන බැංකුව,
ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය,
මඩකලපුව.

07-329

---

## කොමර්පල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ්

### 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ් හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

ගිණුම්අංකය : 1140004293.

2005 සැප්තැම්බර් මස 30 වැනි දින පවත්වන ලද කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ් හි අධ්‍යක්ෂ මණ්ඩලයේ රැස්වීමේ දී මතු දැක්වෙන යෝජනාව විශේෂයෙන්ම සහ ඒකච්ඡන්දයෙන් සම්මත කර ගන්නා ලදී :

ගාල්ල ප්‍රසිද්ධ නොතාරිස් අයි. එස්. විජේසේකර විසින් සහතික කරන ලද්දාවූද, කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ් හි නමට ලියන ලද්දාවූද, 2001 ඔක්තෝබර් මස 11 වැනි දින හා අංක 783 දරන බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම සුමල් කළුතර සහ නයනා මාලනී තේනුවර ණයකරුවන්/උකස්කරු හැටියටද පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරය යටතේ රුපියල් එක්කෝටි දෙලක්ෂ තිස්එක් දහස් එකසිය හයයි ශත විස්සක (රු. 1,02,31,106.20)ක මුදලක් 2005 අගෝස්තු මස 25 වැනි දින වන විට කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ් ට අයවිය යුතුව ඇති හෙයින් එකී රුපියල් එක්කෝටි දෙලක්ෂ තිස්එක් දහස් එකසිය හයයි ශත විස්සක (රු. 1,02,31,106.20)ක මුදලට 2005 අගෝස්තු මස 26 වැනි දින සිට දේපළ විකිණීමේ දිනය දක්වා කාලයට 20% ක වැඩිදුර වාර්ෂික පොළියද, ප්‍රචාරක වියදම් සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු සහ මුදල් ප්‍රමාණයන්ද, තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේනම් ඒ මුදලත් අඩුකොට එකී අංක 783 දරන උකස් බැඳුම්කරය මගින් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ් වෙත උකස් කොට ඇත්තාවූද, මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇත්තාවූද දේපළ සහ පරිශ්‍රය කොළඹ 12, හල්ස්ඩෝප් වීදියේ අංක 99 හි බලයලත් වෙන්දේසිකරු එල්. බී. සේනානායක මහතා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතුයැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ් හි අධ්‍යක්ෂ මණ්ඩලය මේ මගින් යෝජනා සම්මත කර ගනී.

#### උපලේඛනය

1. බලයලත් මානක ඩී. ජී. මෙන්ඩිස් විසින් 1991 නොවැම්බර් මස 11 වැනි දින සාදන ලද අංක 3301 දරන පිඹුර පරිදි දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, අම්බලන්ගොඩ වැල්ලබොඩ පත්තුවේ, අම්බලන්ගොඩ නගර සභා සීමාව තුළ පටබැඳිමුල්ල පිහිටි මහවීදියේ වරිපනම් අංක 273 දරන එහි පිහිටි ගොඩනැගිලි සහ සියළුදේත් සමග වෙන් කරන ලද යාබද කොටස් 10ත් සමන්විත වාල්ලෙවල මාවත බෝදවත්ත වාල්ලේවලවත්තේ යාබද සහ ඒකාබද්ධ ලොට් 3, 4 සහ 5 දරන ඉඩමේ බෙදා වෙන් කරන ලද ලොට් "බී" දරන ඉඩමට මායිම්, උතුරට : එම ඉඩමේ ලොට් "ඒ" ද, නැගෙනහිරට : එම ඉඩමේ ලොට් "ඒ" සහ මහ වීදියද, දකුණට : අන්දුවාස් පටබැඳි පදිංචිව වුන් කැබැල්ල සහ මහවීදියේ වරිපනම් අංක 269 දරන පරිශ්‍රය සහ මහවීදියට පිවිසෙන ප්‍රසිද්ධ පාරද සහ බස්නාහිරට : (පාරක් සහා වෙන් කොට ඇති) ලොට් "සී" ද යන මායිම් තුළ අංක 3301 දරන පිඹුර පරිදි පර්චස් විසිඑකයි දශම තුනයි අටක් (අ. 0, රූ. 0, පර්. 21.38) විශාල ඉඩම් කොටස බලපිටිය ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඒ 172/119 යටතේ ලියාපදිංචිව ඇත.

එකී අම්බලන්ගොඩ නගර සහා සීමාව තුළ පටබැඳිමුල්ල පිහිටි වෙන් කරන ලද කොටස් 10 ට අඩංගු වැල්ලෙවල මාවත බෝදවත්ත සහ වැල්ලෙවලවත්තතේ යාබද සහ ඒකාබද්ධ ලොට් 3, 4 සහ 5 දරන ඉඩමේ (පාරක් සඳහා වෙන් කොට ඇති) උප බෙදීමක් වන ලොට් "සී" දරන කොටස ඔස්සේ ගමන් කිරීමේ අයිතියද සමග වේ. ලොට් "සී" කොටසට මායිම්, උතුරට : එම ඉඩමේ ලොට් "ඒ" සහ අම්බලන්ගොඩ මහ වීදියේ වරිපනම් අංක 275/2, දරන ඩී. එස්. ගුණසේකරට හිමි වැල්ලෙවලවත්තේ කොටසක් ද, නැගෙනහිරට : එම ඉඩමේ ලොට් "ඒ" සහ "බී" ද, දකුණට : මහා මාර්ගයට පිවිසෙන ප්‍රසිද්ධ පාරද සහ බස්නාහිරට : අම්බලන්ගොඩ මහ වීදියේ වරිපනම් අංක 273/2 දරන පී. ඩබ්ලිව්. ලෝරා ද සිල්වාට හිමි වැල්ලෙවලවත්තේ කොටසක්ද යන මායිම් තුළ බලයලත් මානක ඩී. ජී. මෙන්ඩිස් විසින් සාදන ලද 1991 නොවැම්බර් මස 11 වැනි දින හා අංක 3301 දරන පිඹුර පරිදි පර්චස් තුනක් (අ. 0, රූ. 0, පර්. 3) ක් විශාල ඉඩම් කොටස.

ආර්. ආර්. දුනුවිල මහත්මිය,
සමාගම් ලේකම්.

07-343

---

## සීමාසහිත සම්පත් බැංකුව

### 1990 අංක 04 දරන බැංකු මගින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වන වගන්තිය යටතේ සීමාසහිත සම්පත් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

ගිණුම් අංකය : 0035 5001 3966.

2004.06.23 දින පවත්වන්නට යෙදුණු රැස්වීමේදී සීමාසහිත සම්පත් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පහත සඳහන් පරිදි විශේෂිතව හා ඒකමතිකව යෝජනා කොට සම්මත කර ගන්නා ලදී.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අම්බලන්ගොඩ, එඬේරමුල්ල, අංක 16Cහි රාජපක්ෂ මනික්කුතම්බි බන්දුල සිල්වා බන්ධන්දායී

වශයෙන් මාතර ප්‍රසිද්ධ නොතාරිස් එස්. ඩී. හේවාවිතාරණ විසින් සීමාසහිත සම්පත් බැංකුව නමට ලියා සහතික කළ 2002 සැප්තැම්බර් මස 12 දාතම හා 369 සහ 2002 මාර්තු මස 04 දාතම හා අංක 304 දරන උකස් බැඳුම්කර මත බැංකුවට අයවිය යුතු මුදල් ගෙවීම පැහැර හැරීමේ හේතුවෙන්, 2004 ජනවාරි මස 31 වැනි දිනට රුපියල් හයලක්ෂ විසිදහස් හාරසිය පනහයි ශත තිස්තුනක් (රු. 6,20,450.33)ක් ශ්‍රී ලංකාවේ වලංගු මුදලින් සීමාසහිත සම්පත් බැංකුවට අයවිය යුතුව ඇති හෙයින්, එකී රුපියල් හයලක්ෂ විසිදහස් හාරසිය පනහයි ශත තිස්තුනක (රු. 6,20,450.33)ක් සම්පූර්ණ මුදල සමඟ රුපියල් හයලක්ෂ අටදහස් විසිඅටයි ශත අනූඑක (රු. 6,08,028.91)ක් මුදල සඳහා 2004 පෙබරවාරි මස 01 දින සිට වෙන්දේසි දින තෙක් වසරකට සියයට විසිදෙක (22%) බැගින් පොළී මුදල ද සමඟ ප්‍රචාරක වියදම් සහ වෙනත් අයකිරීම් වෙතොත් ඒවාද සමඟ එතෙක් ගෙවා ඇති යම් මුදලක් (වේ නම්) අඩු කොට අයකර ගැනීම සඳහා එකී බැඳුම්කර අංක 369 සහ 304 මගින් සීමාසහිත සම්පත් බැංකුවට උකස් තබන ලද මෙහි පහත උපලේඛනයේ වඩාත් මැනැවින් විස්තර කොට ඇති දේපළ සහ පරිශ්‍රය කොළඹ බලයලත් වෙන්දේසිකාර ඩන්ස්ටන් කෙලාට් විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණාලිය යුතු බවට, 1990 අංක 04 දරන බැංකු මගින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් තමන් වෙත පැවරී ඇති බලය පරිදි සීමාසහිත සම්පත් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා කොට සම්මත කර ගන්නා ලදී.

### උපලේඛනය

1. දකුණු පළාතේ, ගාලු දිස්ත්‍රික්කයේ, වැල්ලබඩ පත්තුවේ, අම්බලංගොඩ නගර සභා සීමාව තුළ එඬේරමුල්ල ග්‍රාමයෙහි පිහිටි එඬේරමුල්ල පාරේ වරිපනම් අංක 16 දරන ගොරකගහවත්ත *නොහොත්* දෙල්ගහ වත්ත, උස්වත්ත ලොට් A සහ B ජුවන්හේවගෙදර වත්ත ලොට් 02 හෙට්ටිතන්ත්‍රීගේ ලොට් A නමැති ඉඩමේ බලයලත් මිනින්දෝරු වී. ගොඩහේන විසින් සාදන ලද 1999 පෙබරවාරි මස 05 දාතම හා අංක 661 C දරන පිඹුරේ නිරූපිත ලොට් 02 B වශයෙන් ලකුණු කොට ඇති උතුරට : එම ඉඩමේම ලොට් 02 A සහ 03 ද, එහෙත් වඩාත් නිවැරදිව ලොට් 02 A සහ 03 ද, නැගෙනහිරට : එම ඉඩමේම ලොට් 05 ද, දකුණට : එම ඉඩමේම ලොට් 04 ද සහ බටහිරට : එම ඉඩමේම ලොට් 03 ද මායිම් වන බලපිටිය ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලය වෙළුම/පත්‍ඉරුව A199/265 යටතේ ලියාපදිංචි කොට ඇති ප්‍රමාණයෙන් පර්චස් දෙකයි දශම හයක් (අ. 0, රූ. 0, පර්. 2.6)ක් වන බෙදා වෙන් කොට සීමා නිර්ණය කළ සම්පූර්ණ බිම් කොටස එහි පිහිටි පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ සෑම සියළු දේ සමග ය.

2. ඉහත කී එඬේරමුල්ල ග්‍රාමයේ පිහිටි උස්වත්ත ලොට් A සහ B, ජුවන්හේවගෙදර වත්ත ලොට් 02 හෙට්ටිතන්ත්‍රිරිගේ ගොරක ගහවත්ත *නොහොත්* දෙල්ගහවත්ත නමැති ඉඩමේ ඉහත කී අංක 661 C පිඹුරේ නිරූපිත 1999 සැප්තැම්බර් 11 දාතම දරන උප කොට්ඨාස සහතික කිරීම පරිදි ලොට් 02A02 වශයෙන් ලකුණු කොට ඇති උතුරට : එම ඉඩමේම ලොට් 2A1 ද, නැගෙනහිරට : එම ඉඩමේම ලොට් 5 ද, දකුණට : එම ඉඩමේ ලොට් 2B ද සහ බටහිරට : එම ඉඩමේම ලොට් 3 ද මායිම් වන බලපිටිය ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලය වෙළුම පත්‍ඉරුව A199/266හි ලියාපදිංචි කොට ඇති අංක 661C දරන පිඹුර පරිදි පර්චස් එකක් (අ. 0, රූ. 0, පර්. 01) වන බෙදා වෙන් කොට සීමා නිර්ණය කල ලොට් 2A2 ද සම්පූර්ණ බිම් කොටස එහි පිහිටි පස, ගහකොළ, ගොඩනැගිලි සහ සෑම සියළු දේ සමඟ ය.

3. ඉහත කී එඬේරමුල්ල ග්‍රාමයේ පිහිටි උස්වත්ත ලොට් A සහ B, ජුවන්හේවගෙදර වත්ත ලොට් 02 හෙට්ටිතන්ත්‍රිරිගේ ලොට් A ගොරක ගහවත්ත *නොහොත්* දෙල්ගහවත්ත නමැති ඉඩමේ ඉහත කී අංක 661 C පිඹුරේ නිරූපිත ලොට් 03 වශයෙන් ලකුණු කොට ඇති උතුරට : එම ඉඩමේම ලොට් 2Aද නමුත් වඩාත් නිවරදි ලොට් 2A1, 2A2 සහ 2B ද, නැගෙනහිරට : එම ඉඩමේම ලොට් 2 එනමුත් වඩාත් නිවරදිව ලොට් 2A1, 2A2 ද, දකුණට : එම ඉඩමේම ලොට් 4 ද සහ බටහිරට : එඬේරමුල්ල පාර ද මායිම් වන බලපිටිය ඉඩම් කාර්යාලයේ වෙළුම පත්‍ඉරුව A199/267 හි ලියාපදිංචි කොට ඇති ප්‍රමාණයෙන් පර්චස් එකොළහක (අ. 0, රූ. 0, පර්. 11)ක් බෙදා වෙන් කොට සීමා නිර්ණය කළ සම්පූර්ණ බිම් කොටස එහි පිහිටි පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ සෑම සියළු දේ සමග ය.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගමේ ලේකම්.

07-381/4

---

## සීමාසහිත සම්පත් බැංකුව

### 1990 අංක 04 දරන බැංකු මගින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වන වගන්තිය යටතේ සීමාසහිත සම්පත් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

ගිණුම් අංකය : 0030 1000 0938.

සීමාසහිත සම්පත් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2004.06.23 දින පවත්වන්නට යෙදුණු රැස්වීමේදී පහත සඳහන් පරිදි විශේෂිත හා ඒකමතිකව යෝජනා කොට සම්මත කර ගන්නා ලදී.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රිකා සමාජවාදී ජනරජයේ වෙන්නප්පුව සඳුන්ගිර හි කන්ලින්ග චන්දන ඇන්ටනි අනුරදේව සිල්වා යන වෙන්නප්පුව සී. ආර්. එස්. යන ව්‍යවහාරික ව්‍යාපාර නාමය යටතේ එකම අයිතිකරු වශයෙන් ව්‍යාපාරික කටයුතු කරගෙන යන අය බන්ධනදායී වශයෙන් වෙන්නප්පුව ප්‍රසිද්ධ නොතාරිස් එච්. ජේ. ඩී. ෆොන්සේකා විසින් සීමාසහිත සම්පත් බැංකුව නමට ලියා සහතික කළ 2001 ජූලි මස 16 දාතම හා අංක 19033 දරන උකස් බැඳුම්කරය මත බැංකුවට අයවිය යුතු මුදල් ගෙවීම පැහැර හැර ඇති බැවින් 2003 සැප්තැම්බර් මස 30 වැනි දිනට රුපියල් හයලක්ෂ හැටහත්දාස් පන්සිය හැටතුනයි ශත තිස් හතරක (රු. 6,67,563.34)ක මුදලක් සීමාසහිත සම්පත් බැංකුවට ශ්‍රී ලංකාවේ වලංගු මුදලින් අයවිය යුතු ඇති හෙයින්, එකී රුපියල් හයලක්ෂ හැටහත්දහස් පන්සිය හැටතුනයි ශත තිස්හතරක (රු. 6,67,563.34)ක සම්පූර්ණ මුදල ද ඒ සමඟ රුපියල් පන්ලක්ෂයක (රු. 5,00,000)ක මුදල සඳහා 2003 ඔක්තෝබර් මස 01 වැනි දින වෙන්දේසි දින තෙක් තවදුරටත් පොළී මුදල ද සමඟ ප්‍රචාරක වියදම් සහ වෙනත් අයකිරීම් වෙතොත් ඒවාද සමඟ එතෙක් ගෙවා ඇති යම් මුදලක් (වේ නම්) අඩු කොට අයකර ගැනීම සඳහා එකී අංක 19033 මගින් සීමාසහිත සම්පත් බැංකුවට උකස් තබන ලද මෙහි පහත උපලේඛනයේ වඩාත් මැනැවින් විස්තර කොට ඇති දේපළ සහ පරිශ්‍රය මහනුවර බලයලත් වෙන්දේසිකාර අයි. ඩබ්ලිව්. ජයසූරිය විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණාලිය යුතු බවට, 1990 අංක 04 දරන බැංකු මගින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් තමන් වෙත පැවරී ඇති බලය පරිදි සීමාසහිත සම්පත් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා කොට සම්මත කර ගන්නා ලදී.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, අලුත්කුරු කෝරළේ, රාගම් පත්තුවේ, ජා-ඇල නගර සභා සීමාව ඇතුළත කණුවන ඇලෙක්ෂැන්ඩ්‍රා මාවත, දෙවන පටුමඟ, වරිපනම් අංක 22 දරන ඇලෙක්ෂැන්ඩ්‍රා එස්ටේට් නමැති ඉඩමෙන් බලයලත් මිනින්දෝරු ඩබ්ලිව්. එල්. ප්‍රනාන්දු විසින් සාදන ලද 1974 අගෝස්තු මස 26 දාතම හා අංක 207 දරන පිඹුරේ නිරූපිත ලොට් බී වශයෙන් ලකුණු කොට දක්වා ඇති උතුරට : අගල සහ එම ඉඩමේම ඉතිරි කොටසට ද, නැගෙනහිරට : අංක 4216 පිඹුරේ නිරූපිත එම්. කුලතිලක සිල්වාට අයත් මෙම ඉඩමේ ලොට් 3 ද, දකුණට : ඇලෙක්ෂැන්ඩ්‍රා පාර සහ බටහිරට : එම ඉඩමේම

ලොට් ඒ ද මායිම් වන ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එච් 38/169 ශීර්ෂය යටතේ ලියාපදිංචි කොට ඇති පර්චස් විසිහතයි දශම පහක් (අ. 0, රූ. 0, පර්. 27.5)ක් වන බෙදා වෙන් කොට සීමා නිර්ණය කළ ඉඩම් කොටසය.

ඉහත කී ඉඩම මෑතකදී කරන ලද සමීක්ෂණයකට අනුව පහත දැක්වෙන පරිදි විස්තර කෙරේ.

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, අලුත්කුරු කෝරළේ, රාගම පත්තුවේ, ජා-ඇල නගර සභා සීමාව තුළ කණුවන ඇලෙක්ෂැන්ඩ්‍රා මාවතේ පිහිටි දෙවන පටුමහ වරිපනම් අංක 22 දරන (බලයලත් මිනින්දෝරු ඩබ්ලිව්. එල්. ප්‍රනාන්දු විසින් සාදන ලද 1974 මාර්තු මස 26 දාතම හා අංක 207 පිඹුරේ නිරූපිත ලොට් බී හි ප්‍රතිමිණුමක් වන) බලයලත් මිනින්දෝරු එම්. ඩී. එඩ්වඩ් විසින් සාදන ලද 2001 අප්‍රේල් මස 23 දාතම අංක 2533 දරන පිඹුරේ නිරූපිත උතුරට : ඇළ ද, නැගෙනහිරට : නෙල්සන් සිල්වාගේ ඉඩම ද, දකුණට : ඇලෙක්ෂැන්ඩ්‍රා පාර ද සහ බටහිරට : අංක 207 පිඹුරේ ලොට් ඒ ද මායිම් වන ප්‍රමාණයෙන් පර්චස් විසිහතයි දශම පහක් (අ. 0, රූ. 0, පර්. 27.5)ක් වන බෙදා වෙන් කොට සීමා නිර්ණය කළ ඉඩම් කොටස.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගමේ ලේකම්.

07-381/3

---

### සීමාසහිත සම්පත් බැංකුව

1990 අංක 04 දරන බැංකු මගින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වන වගන්තිය යටතේ සීමාසහිත සම්පත් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

ගිණුම් අංකය : 0007 1000 6164.

2005 මැයි මස 26 වැනි දින සීමාසහිත සම්පත් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පවත්වන්නට යෙදුණු රැස්වීමකදී මෙසේ විශේෂිතව හා ඒකමතිකව යෝජනා කොට සම්මත කර ගන්නා ලදි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ වැරැල්ලගම අලදෙනියේ දිලානි කොන්ක්‍රීට් වර්ක්ස් යන ව්‍යවහාරික ව්‍යාපාර නාමය, යටතේ එකම අයිතිකරු වශයෙන් ව්‍යාපාරික කටයුතු කරගෙන එකී ජනරජයේ කුඹුරේගම, ගිරිහාගම වලව්ව, අංක 80 හි අබේකෝන් විජේසුන්දර රත්නායක මුදියන්සේ රාළහාමිලාගේ ලාල් සිසිර බණ්ඩාර ගිරිහාගම යන අය බන්ධන්දායින් වශයෙන් මහනුවර ප්‍රසිද්ධ නොතාරිස් ආර්. ඩබ්ලිව්. එම්. සී. රත්නායක විසින් සීමාසහිත සම්පත් බැංකුව නමට ලියා සහතික කළ 1995 සැප්තැම්බර් මස 12 දාතම හා අංක 20032 දරන උකස් බැඳුම්කරය මත බැංකුවට අයවිය යුතු මුදල් ගෙවීම පැහැර හැරීමේ හේතුවෙන් 2000 පෙබරවාරි මස 22 වැනි දිනට එකී බැඳුම්කරය මත ශ්‍රී ලංකාවේ වලංගු මුදලින් රුපියල් පන්ලක්ෂ දොළොස් දහසක (රු. 5,12,000)ක් මුදලක් සීමාසහිත සම්පත් බැංකුවට අයවිය යුතුව ඇති හෙයින්, එකී රුපියල් පන්ලක්ෂ දොළොස් දහසක (රු. 5,12,000)ක් සම්පූර්ණ හිඟ මුදල සමඟ තවත් රුපියල් දෙලක්ෂ හැටහත් දහසක (රු. 2,67,000)ක් මුදල සඳහා වසරකට සියයට විසිතුන (23%) බැගින් 2000 පෙබරවාරි මස 23 වැනි දින සිට වෙන්දේසි දින තෙක් තවදුරටත් පොළී මුදල ද සමඟ ප්‍රචාරක වියදම් සහ වෙනත් අයකිරීම් වෙතොත් ඒවාද සමඟ එතෙක් ගෙවා ඇති යම් මුදලක් (වේ නම්) අඩු කොට අයකර ගැනීම සඳහා එකී අංක 20032 දරන බැඳුම්කර මගින් සීමාසහිත සම්පත් බැංකුවට උකස් තබන ලද මෙහි පහත උපලේඛනයේ වඩාත් මැනැවින් විස්තර කොට ඇති දේපළ සහ පරිශ්‍රය මහනුවර බලයලත් වෙන්දේසිකරු අයි. ඩබ්ලිව්. ජයසූරිය විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණාලිය යුතු බවට, සීමාසහිත සම්පත් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින්, 1990 අංක 04 දරන බැංකු මගින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් තමන් වෙත පැවරී ඇති බලය පරිදි මෙසේ යෝජනා කොට සම්මත කර ගන්නා ලදී.

#### උපලේඛනය

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, තුම්පනේ උඩපළාතේ, ගලගෙදර පිහිටි වී පැලක වපසරිය ඇති පිහිල්ලගහහේන දැනට වත්ත නමැති සම්පූර්ණ ඉඩමට/ඉඩමෙන් බලයලත් මිනින්දෝරු ඩබ්ලිව්. සී. එස්. එම්. අබේසේකර විසින් මැන සාදන ලද 1990 ඔක්තෝබර් මස 20 දාතම හා අංක 162/90 දරන පිඹුරේ ලොට් 2 වශයෙන් ලකුණු කොට නිරූපිත මහනුවර ඉඩම් කාර්යාලයේ වෙළුම/පත්‍රුරුව K 272/220 හි ලියාපදිංචි කොට ඇති ඊසාන දිගට : ඇල ද, ගිණිකොණට : එම පිඹුරටම 1990 නොවැම්බර් මස 12 වැනි දින සාදන ලද අප බෙදුමේ ලොට් 3 A ද, නිරිත දිගට : එම පිඹුරටම 1990 නොවැම්බර් මස 12 වැනි දින සාදන ලද උප බෙදුමේ ලොට් 3 A සහ ප්‍රධාන මාර්ගයේ සිට එන ගම්සභා පාර ද සහ වයඹට ප්‍රධාන මාර්ගයේ සිට එන ගම් සභා පාර සහ ඇල ද මායිම් වන ප්‍රමාණයෙන් පර්චස් දහ අටක් (අ. 0, රූ. 0. පර්. 18) වන බෙදා වෙන් කොට සීමා නිර්ණය කළ සම්පූර්ණ බිම් කොටස එහි පිහිටි සැම සියළු දේ සමඟ ය.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගමේ ලේකම්.

07-381/2

---

### සීමාසහිත සම්පත් බැංකුව

1990 අංක 04 දරන බැංකු මගින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වන වගන්තිය යටතේ සීමාසහිත සම්පත් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

ගිණුම් අංකය : 0033 5000 3370.

2005 සැප්තැම්බර් මස 23 වැනි දින සීමාසහිත සම්පත් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පවත්වන්නට යෙදුණු රැස්වීමකදී මෙසේ විශේෂිතව හා ඒකමතිකව යෝජනා කොට සම්මත කර ගන්නා ලදි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ රත්නපුර, කුඩුගල්වත්ත, අංක 399 හි පදිංචි ෂන්මුගවේලු සිවගුරු යන අය බන්ධනදායී වශයෙන්, කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් කේ. එස්. පී. ඩබ්ලිව් ජයවීර විසින් සීමාසහිත සම්පත් බැංකුව නමට ලියා සහතික කළ 2001 ජුනි මස 22 දාතම හා අංක 1545 දරන උකස් බැඳුම්කරය මත බැංකුවට අයවිය යුතු මුදල් ගෙවීම් පැහැර හැරීමේ හේතුවෙන් 2005 මාර්තු මස 22 වැනි දිනට, ශ්‍රී ලංකාවේ වලංගු මුදලින් රුපියල් හත්ලක්ෂ හැත්තෑ හතර දහස් දහතුනයි ශත දාසයක (රු. 7,74,013.16)ක මුදලක් එකී බැඳුම්කරය මත සීමාසහිත සම්පත් බැංකුවට අයවිය යුතුව ඇති හෙයින් එකී රුපියල් හත්ලක්ෂ හැත්තෑ හතර දහස් දහතුනයි ශත දාසයක (රු. 7,74,013.16)ක සම්පූර්ණ හිඟ මුදල සමඟ තවත් රුපියල් දෙලක්ෂයක (රු. 2,00,000) ක මුදල සඳහා වසරකට සියයට විසිතුන (23%) බැගින් 2005 මාර්තු මස 23 වැනි දින සිට වෙන්දේසි දින

තෙක් තවදුරටත් පොලී මුදල ද සමඟ ප්‍රචාරක වියදම් සහ වෙනත් අයකිරීම් වෙතොත් ඒවාද සමඟ එතෙක් ගෙවා ඇති යම් මුදලක් (වේ නම්) අඩුකොට අයකර ගැනීම සඳහා එකී අංක 1545 දරන බැඳුම්කරය මගින් සීමාසහිත සම්පත් බැංකුවට උකස් තබන ලද, මෙහි පහත උපලේඛනයේ වඩාත් මැනවින් විස්තර කොට ඇති දේපළ සහ පරිශ්‍රය මහනුවර බලයලත් වෙන්දේසිකාර අයි. ඩබ්ලිව්. ජයසූරිය විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණාලිය යුතු බවට, සීමාසහිත සම්පත් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 1990 අංක 04 දරන බැංකු මගින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් තමන් වෙත පැවරී ඇති බලය පරිදි මෙසේ යෝජනා කොට සම්මත කර ගන්නා ලදී.

### උපලේඛනය

සබරගමුව පළාතේ, රත්නපුර දිස්ත්‍රික්කයේ, කුරුවිට කෝරළේ, උඩ පත්තුවේ, කුරුවිට ප්‍රාදේශීය සභා සීමාව ඇතුළත පාතගම ග්‍රාමයේ පිහිටි පැරඩයිස් එස්ටේට් තැඹිලි කැල්ල නමින් හැඳින්වෙන ඉඩමෙන් බලයලත් මිනින්දෝරු එම්. සමරසේකර විසින් සාදන ලද 1999 පෙබරවාරි 11 දාතම හා අංක 5448 දරන පිඹුරේ ලොට් 1 වශයෙන් ලකුණු කොට දක්වා ඇති රත්නපුර ඉඩම් කාර්යාලයේ වෙළුම/පත්‍රිරුව A 718/34 යටතේ ලියාපදිංචි කොට ඇති මායිම්, උතුරට : පාර ද, නැගෙනහිරට : පාර ද, දකුණට : මෙම ඉඩමේ ඉතිරි කොටසද සහ බස්නාහිරට : මෙම ඉඩමේම ඉතිරි කොටස ද මායිම් වන ප්‍රමාණයෙන් රූඩ් එකක් (අ. 0, රූ. 1, පර්. 0) වන බෙදා වෙන් කොට සීමා නිර්ණය කළ ඉඩම එහි ගොඩනැගිලි, වගාවන් සහ අනෙකුත් සියළුම දේ සමඟ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගමේ ලේකම්.

07-381/6

---

## රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

### 1981 හි අංක 62 දරන පනතින් හා 1984 හි අංක 29 දරන පනතින් සංශෝධිත පරිදි 1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජනය බැංකු පනතේ 50 වැනි වගන්තිය යටතේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගැණුනු යෝජනාවයි.

ණය අංකය : ජීපී02/00316/බී2/852.

රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය 2006.03.09 දින පැවැත්වුණු රැස්වීමේ පහත සඳහන් අයුරු විශේෂයෙන් හා ඒකමතිකව තීරණය කරන ලදි.

1. මල්වාන ප්‍රසිද්ධ නොතාරිස් එම්. කේ. ඒ. පෙරේරා විසින් සහතික කරන ල ද 2000.09.28 දින හා අංක 335 දරන උකස් බැඳුම්කරය මත අය විය යුතු මුදල් ගෙවීම මල්වාන පදිංචි එදිරිසිංහ ආරච්චිලාගේ සුමිත්‍රාවතී *නොහොත්* එදිරිසිංහ ආරච්චිගේ සුමිත්‍රාවතී යන අය විසින් පැහැර හැර ඇති බැවින් ද, 2006.01.31 දිනට මුල් ණය මුදල හා එය මත පොළී වශයෙන් රුපියල් දෙලක්ෂ අසූ දෙදහස් අටසිය අසූ තුනයි ශත විසි දෙක (රු. 282,883.22) ක මුදලක්ද, පූර්වෝක්ත බැඳුම්කර අංක 335 ප්‍රකාර ගෙවිය යුතු මුදල සම්පූර්ණයෙන් ගෙවා නිමකරන දිනය වනතුරු දිනකට රුපියල් එකසිය හතරයි ශත හැටහය (රු. 104.66) ක් බැගින් වැඩිපුර පොළී ද, අයවිය යුතුව ඇති බැවින් ද,

2. මෙම දැන්වීමේ පළමුවන ඡේදයේ දක්වා ඇති එකී මුදල සහ 1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 57 වැනි වගන්තිය යටතේ අය කර ගත යුතුව ඇති වියදම් හා මුදල් ආපසු අයකර ගැනිම උදෙසා මෙහි පහත උපලේඛණයේ විස්තර කර ඇති හා රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවට උකස්කර ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම සඳහා සංශෝධනය සහිත 1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය ප්‍රකාර, ගම්පහ, උසාවිය පාර, සණස චතුරශ්‍රය, අංක 15 හි බලයලත් වෙන්දේසිකාර ටී. එම්. එස්. පීරිස් මහතාට බලය පැවරිය යුතු වන්නේ ය.

### උපලේඛනය

ගම්පහ දිස්ත්‍රික්කයේ බියගම ප්‍රාදේශිය සභා සීමාව තුළ වල්ගම ගමේ, වල්ගම මොහොට්ටියාගම-දෙකටන පාරේ පිහිටි වරිපනම් අංක 217 ඒ දරන මීගහවත්ත වඩාත් නිවැරදි ලෙස මීගහවත්ත සහ කෝන්ගහවත්ත ලෙස හඳුන්වන ඉඩමට බලයලත් මිනින්දෝරු ඩී. සී. කෝතලාවල විසින් 1988.05.30 වන දින මැන සාදන ලද අංක 91/88 දරන මිණුම් පිඹුර ප්‍රකාර පිළිවෙලින් කැබලි අංක 1 සහ 2 ලෙස දැක්වෙන ප්‍රමාණයෙන් අ. 0, රූ. 0, පර්. 6.48 ක් සහ අ. 0, රූ. 0, පර්. 27.08 ක් වූ බෙදා වෙන් කරන ලද බිම් කොටස් දෙක සහ ඒ මත පිහිටි සියලු දේත් සමඟ වේ.

ඩබ්ලිව්. ඩී. මෙන්ඩිස්,
*වැඩබලන සාමාන්‍යාධිකාරී.*

අංක 269, ගාලු පාර,
කොළඹ 03,
2006 ජූලි මස 07 වැනි දින.

07-384/7

---

## නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් ලිමිටඩ්

### 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් ලිමිටඩ් විසින් අනුමත කරන ලද යෝජනා සම්මුතියෙන් දැන්වීමය.

පහත දැක්වෙන යෝජනා සම්මුතිය නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් ලිමිටඩ්හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ඒකමතිකව අනුමත කරන ලද බව 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වන වගන්තිය ප්‍රකාරව මෙයින් දැනුම් දෙනු ලැබේ.

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් සී. පී. ආර්. රණසිංහ විසින් සහතික කරන ලද වර්ෂ 2001 ක් වූ සැප්තැම්බර් මස 13 වැනි දිනැති අංක 2556 දරන උකස් බැඳුම්කරය මගින් මොරටුව කල්දෙමුල්ල පාරේ, අංක 123 දරන ස්ථානයේ නිශාන්ත බෝපගේ *හෙවත්* නිශාන්ත ප්‍රදීප් බෝපගේ යන අය විසින් ලබා ගන්නා ලද මූල්‍ය පහසුකම් නිසි ලෙස ආපසු ගෙවීමට ඇපයක් වශයෙන් මෙහි උපලේඛනයෙහි සවිස්තරව විස්තර කර ඇති අයිතීන් දේපළ සහ පරිශ්‍රයන් කොළඹ 01, යෝර්ක් විදියේ අංක 76හි පිහිටි (මින් මතු බැංකුව යනුවෙන් සඳහන් කෙරෙන) නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් ලිමිටඩ් වෙත උකස් කරන ලද හෙයින් ද,

තවද එකී බැඳුම්කරය මත ගෙවිය යුතු මුදල් ගෙවීමට එකී නිශාන්ත බෝපගේ යන අය පැහැර හරින ලදුව වර්ෂ 2005 ක් වූ සැප්තැම්බර්මස 14 වැනි දින වන විට නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් ලිමිටඩ් වෙත එකී බැඳුම්කරය මත රුපියල් හත්ලක්ෂ තුන්දහස් හයසිය හැට දෙකකුත් ශත තිස්තුන (රු. 7,03,662.33) ක මුදලක් දැන් අයවිය යුතුව සහ ලැබිය යුතුව ඇති හෙයින් ද, මෙහි උපලේඛනයෙහි සවිස්තරව විස්තර කර ඇති අයිතීන් දේපළ

සහ පරිශ්‍රයන් එකී රුපියල් හත්ලක්ෂ තුන්දහස් හයසිය හැට දෙකකුත් ශත තිස්තුනක (රු. 7,03,662.33) මුදල ද වර්ෂ 2005 ක් වූ සැප්තැම්බර් මස 15 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා වර්ෂ 2005 ක් වූ සැප්තැම්බර් මස 14 වැනි දින විට කාල ණය මත හිඟව ඇති ප්‍රාග්ධන මුදල වන රුපියල් පන්ලක්ෂ හතලිස් පන් දහස් හත්සිය හැත්තෑ අටකුත් ශත හතලිහ (රු. 5,45,778.40) ක මුදලක් මත එක් වර්ෂයක 24% ක අනුප්‍රමාණය බැගින් තවදුරටත් පොළිය ද සමඟ අනුගාමී ගාස්තු ද ප්‍රචාරය කිරීමේ ගාස්තු ද වැය කරන්නට සිදු වූ වෙනත් ගාස්තු ද පහසුකම් ලබා ගත් දින සිට ගෙවා ඇති (කිසියම් මුදලක් වේ නම්) මුදල අඩු කළ පසු මුදල අයකර ගැනීම සඳහා ත්‍රිවන්ක සහ සේනානායක වෙන්දේසිකරුවන්ගේ ත්‍රිවන්ක සේනානායක මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබීමට 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත මගින් පැවරී ඇති බලතල යටතේ මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ, මොරටුව නගර සභා සීමාවට අයත් කල්දේමුල්ල ග්‍රාමයේ පිහිටි බලයලත් මිනින්දෝරු ආර්. ඩබ්ලිව්. ප්‍රනාන්දු විසින් සාදන ලද වර්ෂ 1965 ක් වූ නොවැම්බර් මස 16 වැනි දින සහ අංක 1282 දරන පිඹුරේ ලොට් 1 වශයෙන් සලකුණු කර ඇති බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම්, උතුරට : කල්දේමුල්ල පාර ද, නැගෙනහිරට : පුනලිතලාරාම විහාරයට අයත් අලුබෝගහ කුරුඳුවත්ත නම් ඉඩමේ ලොට් ඒ ද, දකුණට : පිඹුරු අංක 1282 හි ලොට් අංක 2 සහ 4 ද, බස්නාහිරට : පිඹුරු අංක 1282 හි මාර්ග ප්‍රවේශයක් සඳහා වෙන් කර ඇති ලොට් 2 ද, යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් අටයි දශම එක (අ. 0, රූ. 0, පර්. 8.1) වන ඉඩම් කොටස. මෙය ගල්කිස්ස ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වෙලුම පත්ඉරු එම් 819/194 හි ලියාපදිංචි වී ඇත.

තවද පහත සඳහන් මාර්ග අයිතිය සමඟ වේ.

ඉහත කී කල්දේමුල්ල පාරෙහි පිහිටි අළුබෝගහ කුරුඳුවත්ත නම් ඉඩමෙන් ඉහත කී අංක 1282 දරන පිඹුර ප්‍රකාර බෙදා වෙන් කරන ලද පාරක් සඳහා වෙන් කරන ලද ලොට් 02 දරන බිම් කොටසට මායිම්, උතුරට : කල්දේමුල්ල පාර සහ පිඹුරු අංක 1282 හි ලොට් 01 ද, නැගෙනහිරට : පිඹුරු අංක 1282හි ලොට් 4 ද, දකුණුට : පිඹුරු අංක 1282 හි ලොට් 3 ද, බටහිරට : අලුබෝගහ කුරුඳුවත්තෙහි ලොට් බී 1 ද යන මායිම් තුළ පිහිටි පර්චස් එකයි දශම නවය (අ. 0, රූ. 0. පර්. 1.9) ක් විශාල බිම් කොටස සහ ඊට අයත් සියලු දේද සමඟ ගල්කිස්ස ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එම් 1587/182 හි ලියාපදිංචි කර ඇත.

ඉහත ඉඩම මෑතකදී කරන නැවත මැනීමකට අනුව පහත පරිදි විස්තර කළ හැක.

ඉහත කී පරිදි කල්දෙමුල්ල ග්‍රාමයෙහි පිහිටි කල්දෙමුල්ල පාරේ කලින් වරිපනම් අංක 161 සහ දැනට වරිපනම් අංක 123 දරන (අංක 1282 පිඹුරේ ප්‍රකාර ලොට් 01 හි නැවත මැනීමක් වන) අලුබෝගහ කුරුඳුවත්ත ඉඩමට ජේ. එම්. ඩබ්ලිව්. සමරනායක බලයලත් මානක තැන විසින් මැන සාදන ලද අංක 1426 සහ 2001.07.15 දරන පිඹුරේ ප්‍රකාරෙ ලොට් අංක 01 දරන බිම් කොටසට මායිම්, උතුරට : කල්දේමුල්ල පාර, නැගෙනහිරට : පුලිනතලාරාමය විහාර භූමිය ද, දකුණට : කල්දේමුල්ල පාරෙහි වරිපනම් අංක 123/1 දරන පරිශ්‍රය (පිඹුරු අංක 1282 හි ලොට් 3 සහ 4) සහ අඩි පාර ද, බටහිරට : අඩි පාර ද (පිඹුරු අංක 1282 හි ලොට් 2) ද යන මායිම් තුළ පිහිටි පර්චස් අටයි දශම එක (අ. 0, රූ. 0, පර්. 8.1) ක් විශාල බිම් කොටස සහ ඊට අයත් සියලු දේත් වේ.

මණ්ඩලයේ අණ පරිදි,

තේජ සිල්වා,
සමාගම ලේකම්.

අංක 76, යෝර්ක් වීදිය,
කොළඹ 1.

07-341

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.